# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ වප් අව අටවක පෝදා 2021 ඔක්තෝබර් 28 බ්‍රහස්පතින්දා BUDUSARANA THURSDAY OCTOBER 28, 2021

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 56 වන කාණ්ඩය, 18 වන පත්‍රය , පිටු 20 ආරම්භය 1965 - 06 - 13 මිල රු. 40.00




සේරුවිල මංගල මහ සෑ රදුන් වහන්සේ



# වචනය දෙපැත්ත කැපෙන ආයුධයක් වගෙයි

# පරිහරණය පරිස්සමෙන්

**මජ්ඣිම නිකායේ අභයරාජ කුමාර සූත්‍රය බුදුරජාණන් වහන්සේ විසින් අභයරාජ කුමාරයාට දේශනා කරනු ලැබූ අගනා සූත්‍රයකි. අභයරාජ කුමාරයා බිම්බිසාර රජුගේ පුත්‍රයකු වුව ද, නිගණ්ඨනාථපුත්තගේ අනුගාමිකයකු විය.**

> “බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ දේවදත්ත තෙරුන් මහා පව්කාරයකු බව දේශනා කරන සේක. ඔහු නියත වශයෙන් ම අපායට යන කෙනෙක් ලෙසත්, ඔහු අපායෙන් ගලවා ගන්නට බුදුවරු දාහක් ආවත් නොහැකි බවටත් ප්‍රකාශ කරති.”

බුදුන් දවස සිටි බොහෝ අන්‍යාගමික ශාස්තෘවරුන්ට බුදුරජාණන් වහන්සේ සමඟ වාද කිරීමේ වුවමනාවක් පැවතිණි. එහෙත් ඒ සඳහා බියක් දැක්වූයේ ඔවුන්ගේ කීර්ති නාමයට කැළලක් වේ යැයි යන බියෙනි. නිගන්ඨනාථපුත්‍ර ශාස්තෘවරයා ද එම ගණයෙහි ලා ම සැලකිය හැක්කේ මෙම සූත්‍ර දේශනාවට අදාළ පසුබිම විමසා බැලීමෙනි.

නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයා දිනක් අභයරාජ කුමාරයාට යෝජනාවක් කළේ ය.

“රාජ කුමාරයාණෙනි, ඔබ බුදුරජාණන් වහන්සේ සමග වාද කොට ජය ගතහොත් ඔබගේ කීර්තිය දඹදිව පුරා පැතිරී යනු ඇත. එබැවින් ගොස් බුදුරජාණන් වහන්සේ වාදයෙන් පරාජය කරන්න. ඒ සඳහා වන උපදේශය මම ලබා දෙන්නෙමි”

යනුවෙනි. එනම්, ඔබ උන්වහන්සේ වෙත ගොස්,

“බුදුන් වහන්ස, ඔබ වහන්සේ අන්‍යයන්ගේ හිත් රිදෙන, අප්‍රිය අමනාප වදන් පවසන්නේ ද?

යනුවෙන් ප්‍රශ්න කළ යුතු ය. එයට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ මම එසේ කෙනෙක් නොවේ යැයි පවසන්නේ නම්, ඔබ නැවතත්,මෙසේ විමසන්න

.“බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ විසින් දේවදත්ත තෙරුන් මහා පව්කාරයකු බව දේශනා කරන සේක. ඔහු නියත වශයෙන් ම අපායට යන කෙනෙක් ලෙසත්, ඔහු අපායෙන් ගලවා ගන්නට බුදුවරු දාහක් ආවත් නොහැකි බවටත් ප්‍රකාශ කරති. එයින් දෙව්දත් තෙරුන්ගේ හිත රිදෙන්නේ නැද්ද? එය අප්‍රිය අමනාප කතාවක් නොවන්නේ ද?” යනුවෙනි.

යම් හෙයකින් බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රශ්නයට

“ඔව්, මම අන් අයගේ හිත් රිදවන, අප්‍රිය හා අමනාප දේ පවසමි”

යැයි පිළිතුරු දුනහොත්, එවිට

“එසේ නම් බුදුරජාණන් වහන්සේ සහ සාමාන්‍ය පුද්ගලයන් අතර වෙනසක් නැතේද?”

යනුවෙන් විමසන්න. මේ අයුරින් අභයරාජ කුමාරයාට බුදුරජාණන් වහන්සේගෙන් විමසිය යුතු පැනයන් පිළිබඳ නිගන්ඨනාථපුත්ත ශාස්තෘවරයා ඉගැන්වී ය.

බුදුරජාණන් වහන්සේට මේ ප්‍රශ්න ඇසූ කල ගිලගන්නටත් බැරි, වමාරන්නටත් බැරි යමක් උගුරේ හිරවුණා සේ කටඋත්තර නැතිවේවි යනුවෙන් ද කල්පනා කළේ ය.

අභයරාජ කුමාරයා එදින සවස ම බුදුන් හමුවට පැමිණියේ සෘජුවම උන් වහන්සේගෙන් ප්‍රශ්න නොකොට පසුදින දානය සඳහා ආරාධනා කළේ ය. ඒ අනුව බුදුරජාණන් වහන්සේ අභයරාජ කුමරුගේ මන්දිරයට පසුදින දානය සඳහා වැඩම කළහ. දන් වළඳා අවසන් වූ පසු අභයරාජ කුමාරයා බුදුන් වහන්සේගෙන් ඉහත පරිදි

“ඔබ වහන්සේ අනුන්ගේ හිත් රිදවන, අප්‍රිය හා අමනාප දෑ පවසන්නේ දැයි විමසී ය.

එය එකවර පිළිතුරු දිය නොහැකි මෙන් ම විස්තර වශයෙන් පිළිතුරු ලබා දිය යුතු වූවක් බවට බුදුන් වහන්සේ සඳහන් කළහ. අභයරාජ කුමරුගේ මුවින්

“නිගණ්ඨනාථපුත්‍ර ඉවරයි, නිගණ්ඨනාථපුත්‍ර විනාසයි” යන වදන පිටවිය.

කෙසේ නම් මේ තුළින් නිඝණ්ඨනාථපුත්‍ර විනාශ වන්නේදැ,යි බුදු හිමියෝ විමසූහ.

අභයරාජ කුමාරයා තමන් වාදයට පැමිණි කාරණා මෙන් ම නිගන්ඨනාථපුත්‍ර ශාස්තෘවරයා විසින් තමන්ට ඉගැන්වූ සියල්ල හෙළි කළේ ය.

මේ මොහොතේ දී අපූරු සිදුවීමක් විය. අභයරාජ කුමාරයාගේ පුත්‍රයා පැමිණ ඔහුගේ උකුල මත හිඳගත්තේ ය. එම අවස්ථාව මනාව උපයෝගී කර ගත් බුදුරජාණන් වහන්සේ ඔහුගේ පැනයට පිළිතුරු ලබා දීමට පටන් ගත්හ. “රාජ කුමාරයාණෙනි, ඔබගේ දරුවා උගුරේ ගල් කැටයක් හිර කර ගත හොත් ඔබ කුමක් කරන්නේ ද?” බුදුන් වහන්සේ විසින් විමසූ පැනයට හෙතෙමේ

“බුදුන් වහන්ස, මම දරුවා පැත්තකට හරවා උගුරට ඇඟිල්ල දමා, ඇඟිල්ල නවා කෙසේ හෝ ගල්කැටය ඉවතට ගන්නෙමි”. යි පැවසී ය.

එවිට බුදුහිමියෝ රාජ කුමරුගෙන්

“එවිට දරුවාට රිදෙන්නෙ නැද්ද? දරුවා එයට අකමැති නැද්ද? උගුරෙන් ලේ ගලන්නේ නැද්ද? දරුවා අඬන්නේ නැද්ද?” යනුවෙන් විමසූහ. එවිට කුමාරයා

“බුදුන් වහන්ස, දරුවා අකමැති වුවත්, ඇඬුවත්, ලේ ගැලුවත් කෙසේ හෝ ඒ ගල් කැටය එළියට ගත යුතු ය”

යනුවෙන් පිළිතුරු දුන්නේ ය. එසේ කිරීමට හේතුව කිමදැයි බුදුරජාණන් වහන්සේ විමසූහ. දරුවා කෙරෙහි ඇති ආදරය කරුණාව නිසා බව ඔහු පැවසී ය.

එයම උපමා කොට ගත් බුදුරජාණන් වහන්සේ, ඇතැම්විට වචන භාවිත කිරීමේ දී අන් අයගේ සිත් රිදුණත්, ඔවුන්ගේ යහපත පිණිස වචන භාවිතයෙහි උපයෝගීතාවය දැක්වූහ. ඒ අනුව ලොව පවතින සත්‍යයන් හයක් අතුරින් දෙකක් පමණක් උන්වහන්සේ භාවිතයට ගන්නා බව දැක්වූහ. සයාකාර වූ එකී සත්‍යයන් මෙසේ ය.

යම් වචනය ක් සිදු නොවන්නක් වුවත් (මාළුවකු අහසෙහි පියැඹුවේ යැයි දැක්වූවහොත් එය සිදුනොවන්නකි. එවැනි ප්‍රකාශ ‘අභූත‘ වන අතර, එය ‘භූත‘ වනුයේ කුරුල්ලකු අහසෙහි පියැඹුවේ යැයි දැක්වීමෙනි)

සත්‍ය නොවූ, අවැඩ ගෙන දෙන්නක් යැයි දනී ද, ඒ වචනය අනුන්ට අප්‍රිය වේ ද, අමනාප වේ ද, බුදුරජාණන් වහන්සේ එබඳු වචනය නොකියති.

යම් වචනයක් සිදු වූ (භූත) සත්‍ය වූ, අවැඩ ගෙන දෙන්නක් යැයි දනියි ද, ඒ වචනය ද අනුන්ට අප්‍රිය අමනාප වේ ද, බුදුරජාණන් වහන්සේ එබඳු වචනය ද නොකියති.

ඉතිරිය 15 පිටුවට ...



පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ
සහකාර කථිකාචාර්ය
**මොරවක
සිරි ධම්මරක්ඛිත හිමි**



# අපිරිසුදු සිතිවිලි දුරු කරන්න

# සිත ලෙඩ වුණොත් ජීවිතය ම පිරිහෙනවා

**සිත කියන්නේ ලෝකයේ ඇති අද්විතීය ම ශක්තියක් . සිත ක්‍රියා කරන හැටි, සිත දමනය කර ගන්නා හැටි, සිත දමනය කර ගත නොහැකි වුවහොත් එයින් වන විපාක ගැන බුදුරජාණන් වහන්සේ ඉතා අපූරු ලෙස දේශනා කොට වදාළා. අද අපේ සමාජයේ බොහෝ දෙනෙක් සිරුර සරසන්නට වෙහෙසෙනවා. සිරුරේ ලස්සන ගැන සිතනවා. සිත දියුණු කර ගැනීමට සිතන්නේ නෑ. බොහෝ අභියෝගයන්ට මුහුණ දෙන්නට සිදු වී තිබෙන්නේ ද ඒ නිසාම යි. ලොව පුරා පැතිර ගිය රෝග උවදුර ම ප්‍රමාණවත් ඒ සඳහා උදාහරණ කොට ගැනීමට.**

ඒ ඒ අය මේවාට බලපාන විවිධ හේතු, විවිධ කරුණු පෙන්නුව ද මේ සියලු ම ව්‍යසනයන්ට මූලය වන්නේ පරිහානියට පත්ව ඇති මිනිසාගේ සිත යි.

අපි සම්බුද්ධ දේශනාවට අවධානය යොමු කරමු. ලෝකයේ සම්භවය පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කොට තිබෙනවා.

ලෝක විනාසයෙන් පසුව පෘථිවිය නැවතත් ගොඩ නැඟීම ආරම්භයේ දී මෙම ලෝකය වෙතට ඇදී එන ආභස්සර දෙවියන් ශරීර ස්වභාවයෙන් දීප්තිමත් මෙන් ම ඉතා සියුම් කයක් ඇති ජීවි කොට්ඨාසයක්. මුල් කාලයේ දී ඔවුන් පෘථිවිය ඇසුරේ සැරිසරමින් ප්‍රීතිය පමණක් ආහාරයට ගන්නවා. කල් යත් ම ඔවුන්ගෙන් එක් අයෙක් මෙම පෘථිවියට ඇඟිල්ල ගසා රස බලනවා. ඉන් පසුව සියලු දෙනා යොදයක් මෙන් තිබුණු රස පෘථිවිය ආහාරයට ගන්නට බෙදෙනවා. පසු කාලයේ දී සියුම් කයක් තිබුණ දෙවියන්ගේ ශරීරය රළු වන්නට පටන් ගන්නවා. ඒ ආශාව, නැති නම් රාගය නම් වූ අකුසල චිත්තය වැඩී යාමත් සමඟ යි. මෙම ආභස්සර දෙවියන්ට ස්වයං ජාත හැල්, හදාලතා ආදිය ඉබේ ම පහළ වන්නට වුණා. මුල් කාලයේ දී මොවුන් තුළ රාග, ද්වේෂ, මෝහ අකුසලයන් අල්ප යි. ඒ නිසා මේවා ඉබේට ම පහළ වූවා. එහෙත් කල්යත් ම රාග, ද්වේෂ, මෝහ වැඩි වන විට ඉබේ පහළ වීම නතර වී වගා කිරීමට සිදු වුණා. එසේ ම මුල් කාලයේ දී මොවුන්ට ලිංග ස්වභාවය ද පහළ වූවා. එයින් පිළිබිඹු වන්නේ සිතෙහි ඇති බලවත්කම යි. චිත්ත ශක්තිය කෙතරම් ද කියතොත් සිතට අනුව ද්‍රව්‍යයන්ගේ හැඩගැසීම ද සිදු වන්නට වුණා. එසේ ම ඉන් අනතුරුව වගා කරන්නට යෙදුණු ස්වයංජාත ආදිය සඳහා ද ඈණ කොටා ගන්නට ඔවුන්ට සිදු වුණේ ද්වේශය නම් වූ අකුසල චෛතසිකය වර්ධනය වූ නිසයි. රාග, ද්වේශ, වැඩිවෙන්න වැඩිවෙන්න ඔවුන්ගේ මෝහය, එසේත් නැති නම් මුලාව ද වැඩිවෙන්නට වුණා.

> “රාග , ද්වේෂ , මෝහ නිසා සිත අපිරිසුදු කර ගැනීමෙන් තමන් ම ලෙඩ වෙනවා . මිනිසා සිතෙන් නිකුත් කරන කළු කිරණ නිසා ලෝකය ම දූෂණය වෙනවා . මේ නිසා අකුසල් සිතිවිලි දුරු කිරීම පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති අනුශාසනාවන්ට දැන්වත් ප්‍රමාද නොවිය යුතු යි .”

කෙමෙන් කෙමෙන් පරිණාමය වන්නට යෙදුණු මේ මිනිස් සමාජය වර්තමානය වන විට රාග, ද්වේශ, මෝහ ඇසුරින් උපරිමයට ම ළඟා වී තිබෙනවා. මිනිසාගේ ඇති මෙම කළු කිරණ, එනම් මෙම අකුසල චිත්ත ශක්තීන් නිසා ලෝකයේ ස්වභාවයන්ට ද බලපෑම් සිදු වෙමින් පවතිනවා. මිනිස්සුන්ට සොයා ගැනීමට පවා අපහසු වූ ලෙඩ රෝග සම්භවය වී තිබෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ වා, පිත්, සෙම් යන තුන් දෙස් කිපීමට රාග, ද්වේශ, මෝහ යන චෛතසිකයන් බලවත් වීම හේතුවක් වන බවයි.

හොරණ, මිල්ලෑව ශ්‍රී
අමරතිලකාරාම විහාරවාසී
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
උපාධි අපේක්ෂක
රාජකීය පණ්ඩිත
**වාහල්කඩ පියතරන හිමි**

එසේ ම ආයුර්වේද ග්‍රන්ථ අතර ප්‍රසිද්ධ චරක සංහිතාව, සුශ්‍රැත සංහිතාව, අෂ්ඨාංගහෘදසය සංහිතාව වැනි ආයුර්වේද ග්‍රන්ථයන් මගින් පවා පෙන්වා දෙන්නේ මිනිසාගේ ලෙඩ රෝග වැඩි වීමට හේතු වන ප්‍රධානම කරුණක් වන්නේ මිනිස් සිතම වන බවයි.

දිනෙන් දින බලයට, ධනයට ඇලෙමින්, පොර බදිමින්, එකිනෙකා පෙළා ගනිමින් ගමන් කරන මිනිසාට ධර්මයක් හෝ සදාචාරයක් පෙනෙන්නේ නෑ. අම්මා, තාත්තා, සහෝදරිය පෙනෙන්නේ නෑ. කෙසේ හෝ තමන්ගේ පැවැත්ම උදෙසා පමණයි කටයුතු කරන්නේ. ඒ වගේ ම ද්වේශය නම් වූ අකුසල මූලය නිසා මොන තරම් දුරට මිනිස් සිත දූෂණය කර ගෙන තිබෙනවා ද? අතීතයේ අපේ මුතුන් මිත්තෝ මිනිසුන්ට පමණක් නොවෙයි, සතා සිවුපාවාට පවා මෛත්‍රිය පැතිර වූ ආකාරය මොන තරම් අපූරු ද?

අංගුත්තර නිකායේ “නිබ්බේධික“ සූත්‍රයේ දී බුදු රජාණන් වහන්සේ සඳහන් කරන්නේ

“චේතනාහං භික්කවේ කම්මං වදාමි“

ලෙසටයි. චේතනාවට අනුව කර්මය සිදු වෙනවා. එම කර්මයන්ට අනුව විපාක ද ලැබෙනවා. මිනිසා රාග, ද්වේෂ, මෝහ යන අකුසල චේතනාවන් වපුරන විට ඒවාට අනුව ප්‍රතිඵල ද ලැබෙනවා. මේ වන විට පවා මුළු ලෝකය ම විවිධ වසංගතවලින් වෙළී පවතිනවා. මෙයට හොඳම උදාහරණය වන්නේ වර්තමාන කොරෝනා වසංගත තත්ත්වයයි. මෙවැනි වෛරස්වලට පවා මූලික හේතුව වන්නේ රාග. ද්වේෂ, මෝහවලින් අන්ධ වී මිනිසා සිදු කරන අධම ක්‍රියාවන්. පරිසරය විනාශ කොට, ගන්නා හුස්ම ටික පවා විසක් බවට පත්කර ගෙන තිබෙන්නේ මිනිසා ම යි. පානය කරන ජලය පවා විෂ මිශ්‍ර ජලය බවට පත්කර ගෙන තිබෙන්නේ ද මිනිසාම යි. ආහාරයට ගන්නා දේ පවා වස බවට පත්කර ගෙන තිබෙන්නේ අනිත් මිනිසුන් ගැන නොසිතා තම වෙළ ඳාම ගැන ම පමණක් සිතන දූෂිත සිත නිසයි. මත්වතුර, මත්ද්‍රව්‍ය පවා ලෝකයට බෙදා හැරීමට යොමුවන්නේ පව්කාර සිත නිස යි.

අධ්‍යාපනය තුළ පවා ඇත්තේ දුවන ගමනක්. එමඟින් බොහෝ විට සිදු වන්නේ සිත් දියුණු නොකර රොබෝවරුන් පමණක් සමාජයට දායාද කිරීමයි. අපේ මුතුන් මිත්තෝ ජීවිතය යනු කුමක් දැයි වටහාගෙන සිටියා. ජීවිතය කියන්නේ මුදල් ම පමණක් ද? එකිනෙකාට සිනාසීමටවත් වෙලාවක් මේ ගමන තුළ තිබෙනවා ද? අතීත හෙළයා සතු ව තිබූ වටිනා ම වස්තු වූයේ දූෂ්‍ය නොවූ හිතයි. එය ඔවුනට මෙලොව මෙන් ම පරලොව ද සැප ලබා දුන්නා.

රාග, ද්වේෂ, මෝහ නිසා සිත අපිරිසුදු කර ගැනීමෙන් තමන් ම ලෙඩ වෙනවා. මිනිසා සිතෙන් නිකුත් කරන කළු කිරණ නිසා ලෝකය ම දූෂණය වෙනවා. මේ නිසා අකුසල් සිතිවිලි දුරු කිරීම පිළිබඳ ව බුදු රජාණන් වහන්සේ දේශනා කර ඇති අනුශාසනාවන්ට අනුගත වීමට මිනිසා දැන්වත් ප්‍රමාද නොවිය යුතු යි. බුදු දහමට අනුව එකිනෙකාට මෛත්‍රිය වැඩිය හැකි නම්, ගහට කොළට පවා ආදරය කළ හැකි නම්, අපා දෙපා, සිව්පා, බහුපා ඕනෑම සත්වයකුට මෙත් වැඩිය හැකි නම්, තමා ගැන පමණක් නොසිතා අන් අය ගැන ද සිතිය හැකි නම් මේ ලෝකයේ අර්බුදකාරී තත්ව පහවී යනවා. කලට වැසි වසිනවා. කෙත් වතු සාර වෙනවා. ජීවන ගමනේ වේගයෙන් දිව යන ඔබට නතර වූ පසු ඉතිරි වන්නේ මොනවා දැයි සිතීමට දැන් කාලය පැමිණ තිබෙනවා.

# බුදුරජාණන් වහන්සේගේ

## දෙතිස් මහා පුරුෂ ලක්ෂණ



**බුදුරජාණන් වහන්සේ සමඟ භික්ෂූන් වහන්සේ පන්සියයක් පමණ සදහම් චාරිකාවෙහි යෙදුන සේක. එකල ත්‍රිවේධයෙහි පරතෙර පැමිණි, නොයෙක් විෂයයන් පිළිබඳ මනා දැනුමක් ඇති, විශේෂයෙන් මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි විශේෂඥ, බ්‍රහ්මායු නම් විසි එක් හැවිරිදි උගත් බමුණු පඬිවරයෙක් මිථිලා නම් නගරයෙහි වාසය කළේ ය.**

මේ අනුව බුදුරජාණන් වහන්සේ චාරිකාවේ යෙදෙන බවට බ්‍රහ්මායු බමුණු පඬිවරයාට දැන ගන්නට ලැබිණ. නව අරහාදී බුදු ගුණයෙන් යුක්ත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දැක ගන්නට ඇත්නම් ඉතා මැනවයි බමුණු පඬිවරයාට සිතිණ. බ්‍රහ්මායු බමුණු පඬිවරයාට එතුමා සේ ම දැන උගත් උත්තර නම් ශිෂ්‍යයෙක් විය. පඬිවරයා තම ශිෂ්‍යයා කැඳවූයේ ය.

"දරුව, බුදුරජාණන් වහන්සේගේ යසස, කීර්තිය දස දෙස පැතිර ඇත. ඔබ උන්වහන්සේ හමුවට යන්න. උන්වහන්සේ සතු වනවා යැයි කියන දෙතිසක් පුරුෂ ලක්ෂණ ඇත්ත වූවක් ද, එසේත් නැති නම් නැති දෙයක් ඇතැයි වංචාවෙන් පෙන්වීමෙන් ඇති වූ කීර්ති ඝෝෂාවක්දැයි පරීක්ෂා කරන්න. අප දන්නා මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයට අනුව දෙතිසක් මහා පුරුෂ ලක්ෂණ සියල්ල යමකු සතු වේ ද, ඔහු ගිහි ගෙයි වාසය කළහොත් සක්විති රජ වීමට නියමිත ය. ගිහි ගෙය හැර පැවිදි වූවහොත් කෙලෙස් නසා අර්හත් සම්මා සම්බුදු වන්නේ ම ය."

යැයි බ්‍රහ්මායු පඬිවරයා ඒ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ සියල්ල බුදුරජාණන් වහන්සේ සතු වේ දැයි පරීක්ෂා කොට පැමිණෙන්නැයි කියා උත්තර මානවකට බාර කළේ ය.

ගුරුතුමාගේ අණට කීකරු වූ උත්තර මානවක, ගුරුවරයාට වැඳ සමුගෙන බුදුරජාණන් වහන්සේ සමීපයට ගියේ ය. උන්වහන්සේ වෙත ගොස් වැඳ එකත්පස්ව හිඳගෙන සම්බුදු සිරුරෙහි මහා පුරුෂ ලක්ෂණ එකින් එක පරීක්ෂා කරන්නට විය. මේ අනුව පුරුෂ ලක්ෂණ දෙකක් හැර අනෙක් පුරුෂ ලක්ෂණ ඔහු දුටුවේ ය. උත්තර මානවකයා බුදුන් වහන්සේගේ පුරුෂ ලක්ෂණ පරීක්ෂා කරන බව දුටු බුදුරජාණන් වහන්සේ, ඔහු ලකුණු දෙකක් හැර අනෙක් ලකුණු දුටු බවත්, ඒ දෙක හැර පිළිබඳව සැක කරමින්, විමතියට පත්වෙමින්, නො පැහැදීමෙන් සිටින බවත් දැන ඒ ලකුණු දෙක ද ඔහුට පෙනෙන සේ ඍද්ධියක් කළ සේක.

තම ගුරුවරයා සඳහන් කළ පරිදි බුදුරජාණන් වහන්සේ දෙතිසක් මහා පුරුෂ ලක්ෂණවලින් යුක්ත බව උත්තර මානවක දැන ගත්තේ ය. ගුරුවරයා සඳහන් නො කළ ද වෙන යමක් පිළිබඳ ගුරුවරයා ප්‍රශ්න කළහොත් එයට පිළිතුරු දීම ද අවශ්‍ය වන බැවින් බුදුරජාණන් වහන්සේගේ ක්‍රියාකලාපය පිළිබඳ ව, යන එන තැන්වල කරන ලද දේශනා විලාසය පිළිබඳ පරීක්ෂණයක් කළ යුතු යැයි සිතීය. ඒ අනුව පුරා සත් මසක් පර්යේෂණයක යෙදුණේ ය. එම නිසාම උත්තර මානවකට බුද්ධ පරීක්ෂක, බුද්ධ විමංසක යන අන්වර්ථ නාමයන් පටබැඳුණු බව අටුවාවල සඳහන් වේ. මේ අනුව උත්තර මානවක සත් මසක් පර්යේෂණයෙන් පසු තම ගුරුතුමා වෙත ගොස් බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව ඇති වී තිබෙන කීර්ති රාවය ඇත්ත වූ ම දෙයකින් හට ගත්තක් බව පැවසීය.

මේ අනුව දීඝ නිකායේ ලක්ඛණ සූත්‍රයෙහි අන්තර්ගත වන්නේ ලක්ෂණ ශාස්ත්‍රයට අනුකූල ව පුරුෂයන්ගේ රූප ලක්ෂණ හඳුන්වන ආකාරයයි. දෙතිස් පුරුෂ ලක්ෂණයන් හඳුන්වන විට පුරුෂයන්ගේ දෙපතුලින් ආරම්භ කොට අනුපිළිවෙළින් හිස දක්වා විස්තර කෙරේ. එම නිසා මේ චාරිත්‍ර ධර්මයට අනුකූල ව බුදුරජාණන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ විස්තර වන්නේ ශ්‍රී පතුලේ සිට සම්බුදු සිරස දක්වා වූ අනුපිළිවෙළිනි,



මහනුවර මල්වතු මහාවිහාරවාසී
කර්මවාගාචාර්ය
ශාස්ත්‍රවේදී
**තිබ්බටුවාවේ
ශ්‍රී සිද්ධාර්ථ හිමි**

| | |
|---|---|
| සුප්පතිට්ඨිතපාදෙ | - මනාව පිහිටි පාද ඇත්තේ ය |
| චක්කානි ජාතානි | - යටිපතුල්හි මඟුල් ලකුණු ඇත |
| ආයතපණ්හි | - දික් වූ විලුඹ ඇත |
| දීඝංගුලි | - පිරිපුන් දික් වූ ඇඟිලි ඇත |
| මුදුත එන හත්ථපාදෙ | - ඉතා මෘදු අත් පා ඇත |
| ජාලහත්ථ පාදෙ | - නම්‍යශීලී අත් පා ඇත |
| උස්සංඛපාදෙ | - පා වල ගොප් ඇත. ඉහළින් පිහිටා ඇත |
| ඒණි ජංගතා | - ඕලු මුවකුගේ බඳු කෙණ්ඩා ඇත |
| ආජානුලම්බි හත්ථනා | - සිටි වනම නොනැමී දෙ අත්ලෙන් දෙදණ ස්පර්ශ කිරීමේ හැකියාව ඇත |
| කෝසෝහිත වත්ථගුය්හෝ | - කෙමියක බහාලූ පුරුෂ නිමිත්ත ඇත |
| ස්වර්ණවණ්ණො | - ශ්‍රී දේහය රන්වන් පැහැ ඇත |
| සුඛුමච්ඡවි | - ඉතා සියුම් සම නිසා ශරීරයේ දාඩිය, තෙල්, කුණු නොඇලේ. |
| ඒකේකලෝමෝහෝති | - එක් ලෝම කූපයක එක් ලෝමයක් පමණක් පිහිටීම |
| උද්ධග්ගලෝමෝ | - ලෝම දකුණට කරකැවී උඩට හැරී පිහිටා ඇත. දෙබැම අතර ඌර්ණ රෝම ධාතුව පිහිටා ඇත. |
| බ්‍රහ්මුජ්ජුගත්තෝ | - බ්‍රහ්මයකුගේ මෙන් සෘජු ශරීරයක් ඇත |
| සන්තුස්සදතෝ | - පිටි අතුල්, පිටි පතුල් දෙක, උරහිස් දෙක, කොන්ද යන සත් තැනම තථාගත ශරීරයේ ඇත. නහර මතු නොවී පිහිටා තිබීම |
| සීහ පුබ්බද්ධ කායො | - තථාගත ශරීරය සිංහයාගේ ඉදිරි ශරීරය මෙන් හැම තැනම පිරිපුන් ය |
| චිත්තන් රාසො | - පිටෙහි වූ පිරිපුන් මාංශ ඇත |
| නිග්‍රොධපරිමණ්ඩලො | - සමව පිහිටි ශරීරය, උස පමණට ගැලපෙන මහතින් යුතු බව |
| සමවත්තක්ඛන්ධො | - මනාව වට වූ ගෙල කතා කිරීමේදී නහර හෝ උගුරු ඇටය මතු නොවී මිහිරි හඬ නැගේ |
| රසග්ග සග්ගි | - මුඛයට තබන ලද ඉතාම සුළු ආහාරයක වුව ද රස සකල ශරීරයෙහි පැතිරීම |
| සීහ හනු | - සිංහයාගේ යටි හක්ක මෙන් උඩ යටි හනු දෙකම පූර්ණ ව පවතී |
| චත්තාලීස දන්තො | - දන්තයන් සතළිහක් පිහිටීම |
| සමදන්තො | - සම ව පිහිටි දත් ඇති බව |
| අවිරළ දන්තො | - විවර හිඩැස් නැති සේ දත් එකට බැඳි තිබීම |
| සුසුක්ත දාඨො | - සුදෝ සුදු වූ දන්තයන් ඇත |
| පහූත ජිව්හෝ | - පුළුල් වූ ජිව්හා ධාතුව ඇත |
| බ්‍රහ්මස්සරො | - බ්‍රහ්මයාගේ බඳු මිහිරි හඬ ඇත |
| අභිනීල සුනෙත්තො | - නිල්වන් නෙත් ඇත |
| ගෝපඛුමො | - ළදරු වස්සකුගේ බඳු නෙත් ඇත |
| උණ්ණාලක්ඛණතා | - දකුණට කරකැවුණු ඌර්ණ රෝම ධාතුවක් පිහිටා ඇත |
| උණ්හීස සීහො | - සෙස්සන්ට නොමැති දිග, පුළුල්, උස් වූ නළල් තලයක් පිහිටා ඇත |

# අනුන් ගැන ඇති කෝපය ගලේ කෙටූ අකුරක් වගේ ද?

**ජිවිතය පහතට ඇද දමන චිත්තවේග අතර තරහව ප්‍රධාන වෙනවා. විවිධ මට්ටම්වල දී එය දෝස, ව්‍යාපාද, පටිඝ, කෝධ, ආදී ලෙස හැඳින්වෙනවා. අංගුත්තර නිකායේ ක්‍රෝධ වර්ගයෙහි සඳහන් වන්නේ ක්‍රෝධය, බද්ධ වෛරය ඇති පුද්ගලයා දුක සේ වාසය කරන බවයි. පිරිහීමට පත්වන බවයි. මරණින් මතු නිරයෙහි උපදින බවයි.**

දක්ෂ රියදුරෙක් විසින් ඉතා වේගයෙන් දුවන රථයක් මනාව හසුරුවා ගනු ලබනවා. එමෙන්, යම් පුද්ගලයෙක් සිතෙහි ක්‍රෝධය මැඩ පවත්වා ගන්නේ නම්, ඔහු නියම රියදුරකු වන බව ද, අන් රියදුරන් හුදෙක් රැහැන් අල්ලා ගත් අය පමණක් බව ද දහමෙහි සඳහන් වෙනවා.

ක්‍රෝධය දිනිය හැකි වන්නේ අක්‍රෝධයෙනුයි. ධම්මපදයේ යමක වග්ගයෙහි දී "නහී වෙරෙන වෙරානී යනුවෙන්" වෛරයෙන් වෛරය කිසි කලෙකත් නොසන්සිඳෙන බවත්, අවෛරයෙන් ම වෛරය සන්සිඳෙන බවත් පැහැදිලි කරනවා. එය පෙර සිට ම පැවත එන බුද්ධාදී උතුමන්ගේ ධර්මයක්. යම් කෙනෙක් මට බැන්නා, ගැසුවා, මා සතු දැය පැහැර ගත්තා යැයි සිත තුළ බද්ධ වෛරය උපදවන්නේ නැති නම් ඔහුගේ වෛරය සංසිඳෙන බව එම වර්ගයෙහි "අක්කොච්ඡි මං අවධි මං" යන ගාථාවෙන් පැහැදිලි කරනවා.

අංගුත්තර නිකාය, තික නිපාත භරණ්ඩු වග්ගයට අනුව තථාගතයන් වහන්සේ මිනිසුන් වර්ග හතරක් ගැන සඳහන් කර තිබෙනවා.

**ගලේ කෙටූ අකුරු -**

සමහර අය ගලේ කෙටූ අකුරු වගෙයි. එවැනි අය සුළු දේකට පවා කිපෙනවා. ඒ විතරක් නොවෙයි, ඔවුන් එම කෝප සහගත බව දිගු කාලයක් තබා ගන්නවා. ක්‍රෝධය සහ බද්ධ වෛරය යන මේ දරුණු සිතිවිලි නිසා නිරන්තරයෙන් පෙළෙනවා.


**වැල්ලේ ලියූ අකුරු -**

සමහර පිරිස් වැල්ලේ ලියූ අකුරු වගෙයි. වැල්ලේ ලියූ අකුරක් වැනි පුද්ගලයා ඉක්මනින් කෝපයට පත් වෙනවා. එහෙත් ඒ කිපුණු සහගත බව වැඩි කාලයක් තබා ගන්නේ නැ.

**දියෙහි ලියූ අකුරු -**

සමහර මිනිසුන් දියෙහි ලියූ අකුරු වගෙයි. ඔවුන් තුළ කෝපය රැඳෙන්නේ නැ. ඉතා ඉක්මනින් නැතිවී යනවා.

"මුලින් ම කෝපය නිසා ඇතිවන ආදීනව ගැන සිතන්න."



පැල්මඩුල්ල ඓතිහාසික ශ්‍රී සුදර්ශන ධර්මශාලා පුරාණ විහාර භාරකාර අධ්‍යාපනවේදී
**ගලගම කුසලධම්ම හිමි**

**සුළඟේ ලියූ අකුරු -**

සමහර අය සුළඟේ ලියූ අකුරු වගෙයි. සුළඟේ ලියූ අකුරු වැනි වූ පුද්ගලයා කෝපය කිසිසේත් ම ගණන් ගන්නේ නැ. මෙවැනි පුද්ගලයාගේ සිත නිරතුරුව ම සන්සුන්. කෝපය උපදින්නේ නැ. ඒ නිසා කිසිදු සැලීමක් ද නැ.

මෙහි හතර වැනි වර්ගයට අයත් වන්නේ රහතන් වහන්සේලායි. තුන් වැනි වර්ගයට පැමිණිය හැකි නම් ඉතා වැදගත් වෙනවා. එහෙත් පළමු වර්ගයේ කෙනෙක් නම් නිතර කේන්තියෙන් පිපිරෙනවා. අදාළ වූ සිදුවීම අමතක කරන්නේ නැ. ඒ ගැනම සිත සිතා අනිකා කෙරෙහි ද්වේශ සහගත ව හැසිරෙනවා. කලක් ගිය පසු කෝපය වෛරයකට පෙරළෙනවා. ඒ වෛරය බද්ධ වෛරයකට වුව ද පෙරළිය හැකියි.

නිතර නිතර කේන්ති ගන්නා පුද්ගලයකුට එය පාලනය කිරීම සඳහා කෙටි කාලීන ක්‍රම අනුගමනය කළ හැකි වනවා. ඒ පහත සඳහන් ආකාරයට යි.

මුලින් ම කෝපය නිසා ඇතිවන ආදීනව ගැන සිතන්න. කෝප නොවීමේ වැදගත්කම අවබෝධ කර ගන්න. ඒ අනුව ඔබට කෝප නොවී සිටීමට අධිෂ්ඨාන කර ගත හැකියි.

කෝපය ඇතෙන විට ගණන් කිරීමෙන් කාලය ගෙවන්න. දහයට ගණන් කිරීමෙන් ආරම්භ කරන්න. බෙහෝ සෙයින් කෝපය ඇතෙනවා නම් පනහට හෝ සියයට ගණන් කරන්න. එවිට ටිකෙන් ටික කෝපය පාලනය කර ගන්නට හැකි වෙනවා.

කෝපය පැමිණි විගස දැන් මම කෝප සහගතවයි සිටින්නේ යනුවෙන් සිතන්න. එසේ සිතමින් වහාම නිහඬ වන්න. ඒ වගේ ම නිහඬ වී කිසියම් සතුටුදායක දෙයක් පිළිබඳ ව සිත යොමු කරන්න. ඒ ගැන කල්පනා කරන්න. මෙහිදී ඔබට සුවිශේෂී දෙයක් සිදු කළ හැකියි. ඒ බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් සිහි කිරීමයි. එවිට කෝපය නිවී ගොස් සිතට සාමය ඇතෙනවා. සිත සැහැල්ලු වනවා.

කෝපය ඇතුණු වහා ම ඊට හේතු වූ පුද්ගලයාගේ හොඳ ගතිගුණ පිළිබඳ සිතන්න. ඔහුගේ හෝ ඇයගේ දුර්ගුණයන් ගැන නො සිතන්න. සද්ගුණයන් ගැන ම සිතන්න.

කේන්තිය පාලනය කිරීම උදෙසා මේ කරුණු කෙටි කාලීන ක්‍රම ලෙසින් භාවිත කළ හැකි වනවා.

නිතර කේන්තිය ඇතෙන අයට එය පාලනය කර ගැනීම සඳහා දිගු කාලීන ක්‍රම ද අනුගමනය කළ හැකියි. ඒ අනුව තථාගතයන් වහන්සේ සැම දෙනාට ම අනුගමනය කළ හැකි ධර්මයන් අටක් පිළිබඳ දේශනා කොට වදාළා. ඒ, ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සුඛ සහ දුක්ඛ යන අට ලෝ දහමින් කම්පා නොවීමයි.

තරහ හෝ කෝපය ඇති වන හේතුවෙන් ඈත්වීම හෙවත් හේතුව මගහැර යාම තවත් දිගු කාලීන විසඳුමක්. රූපවාහිනියේ යම් නිශ්චිත පුවත් බැලීමෙන් දේශපාලකයකු කෙරෙහි ක්‍රෝධයක් ඇති වෙනවා නම් එම පුවත් නොබලා සිටීම එයට විසඳුමක්. මිල වැඩි, ගුණත්වය අඩු යම් භාණ්ඩයක් හෝ සේවයක මිල හේතුවෙන් ද එසේ කෝප සහගත බවක් ඇතෙනවා නම්, එම භාණ්ඩය හෝ සේවය මිලදී නොගැනීම, වෙනත් ආදේශයකට යොමුවීම ඒ සඳහා විසඳුමක් වනවා.

යම් ඇන්වීමක් බැලීමෙන්, යම් ගීතයක් ඇසීමෙන් නිතර කේන්තිය මතු වෙනවා නම් එම ඇන්වීම නොබැලීම, එම ගීතයට සවන් නොකිරීම කේන්තිය පාලනයට හා එය මගහැරීමේ ක්‍රමයක් ලෙස අත්හදා බලන්නට පුළුවන්.

අංගුත්තර නිකාය දසක නිපාතයේ දසධම්ම සූත්‍රයේ එන "කම්මස්සකොම්හි කම්මදායාදෙ කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො" යන කර්මයේ අයිතිකාරීත්වය මතක තබා ගැනීමෙන් ද කෝපය පාලනය කර ගන්නට හැකිවනවා. ඒ අනුව ඔබ කරන දෙයෙහි අයිතිකාරයා ඔබ ම යි. අන් කවරකු හෝ නොවෙයි. ඔබ කළ කී දේ ඔබ පසු පස එනවා.

***කෝපය පාලනය කර ගැනීම පිළිබඳ බුදුදහමේ ඉගැන්වීම් ලබන සතියේදීත් විමසා බලමු.***

# කාන්තාව බබළවන මිල කළ නොහැකි ආභරණය පිරිසුදු චරිතයයි

**කාන්තාවකගේ සැබෑ ලස්සන මතු වන්නේ ඇයගේ චරිතයෙනු යි. බෞද්ධ කාන්තාවකට ඒ සඳහා ගුරු හරුකම් ගන්නට හොඳම චරිත අතරින් විශාඛා චරිතය සුවිශේෂී යි. පසු ගිය වප් පුර පසළොස්වක පෝදා පුවත්පතින් අපි විශාඛාවගේ චරිතයේ අපූර්වත්වය ගැන කරුණු කිහිපයකින් දැනුම්වත් වුණා. මේ එම ලිපියේ ඉතිරි කොටසයි.**



### පරිත්‍යාගයේ උතුම් බව

මහා දානපතිනියක ලෙස බුද්ධ ශාසනය තුළ සම්භාවනාවට පාත්‍ර වූ විශාඛාවෝ මිල කළ නොහැකි අගයෙන් යුත් සිය මේල පළඳනාව විකුණා එම මුදලින් බුදුරජාණන් වහන්සේ ඇතුළු මහා සංඝයා වහන්සේ වෙත පූර්වාරාම විහාරය කරවා පූජා කරන ලද බව ප්‍රකට ය. මෙහි දී අපගේ අවධානය යොමු විය යුතු චරිත ලක්ෂණය වන්නේ ඇය ආභරණවලින් තම ශරීරයේ බාහිර අලංකරණය ගැන සැලකිලිමත් නොවූ බවයි. ආධ්‍යාත්මික ගුණයෙන් පෙහොසත් වූ විශාඛාව ඊට වඩා උතුම් කාර්යයක් වෙනුවෙන් සිය භෞතික සම්පත් යෙදවීමෙන් තෘප්තියක් ලැබීමේ ගුණාංගය මනාව ප්‍රගුණ කළ බව පෙනේ.

එමෙන් ම බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට නිති දන් දීමෙන් පමණක් නොව කුඩා සාමණේර ස්වාමින් වහන්සේගේ සිත් දැන ගෙන උන්වහන්සේට මවක මෙන් දයාව කරුණාව පාමින් සංග්‍රහ කිරීමට ඇය නිහතමානී වූවා ය.

විශාඛාව සිය නිවසේ මෙහෙකරුවන්ට පමණක් නොව සතා සිව්පාවා කෙරෙහි ද අපමණ කරුණාවක් දැක් වූ බවට පුවතක් වේ. මැදියම් රැයක පැටවකු බිහි කිරීමේ දී ප්‍රසූත වේදනාවෙන් දුකට පත් වූ වෙළඹකට මුළු රාත්‍රිය පුරා ම සාත්තු කිරීමට තරම් ඇයගේ අනුකම්පාව අසීමිත වූ බව පෙනේ. යුතුකම් ඉටුකිරීමේ දී අවස්ථාවට ගැළපෙන ලෙස තම ධනය, බලය, තරාතිරම වැනි දෑ පසෙකලා ත්‍යාගශීලී ව කටයුතු කිරීමට ඇය දක්ෂ වූවා ය.

### ජීවත්වීමේ අවබෝධය

ඉතා නීරෝගී කාය බලයෙන් යුක්තව වසර 120ක් ජීවත් වීමට විශාඛාවට හැකි විය. දූ දරුවන් විසිදෙනකු සමඟ පරම්පරා හතරක මුණුපුරු මිණිපිරියන් දැකීමට තරම් ඇය වාසනාවන්තියක් වූ වා ය. ගිහි ජීවිතයේ දී එළඹෙන සියලු කාර්යයන් මනා සංයමයෙන්, ගැටුම්වලින් තොර ව, සැම දෙනාගේ ම සිත දිනා ගනිමින් ඉටු කිරීමට ඇය දක්ෂ වූ වා ය. ජීවිතය පිළිබඳ යතාර්ථය හෙවත් වෙනස් වන බව වටහා ගැනීම මඟින් සහ ඊට අනුකූල වන සේ දෛනික ජීවිතයේ දී මුහුණපෑමට සිදුවන ලාබ–පාඩු, කීර්ති–අපකීර්ති, ප්‍රශංසා–ගැරහුම්, දුක–සැප, යන අට ලෝ දහම පිළිබඳ විමසුම් ඇසින් දැකීමේ පරිණත බව විශාඛාවගේ ජීවිතය තුළින් වර්තමාන සමාජයට ලබා ගත හැකි සුවිශේෂී ආදර්ශයකි.

පතිකුලයට පිවිසි විශාඛාවට නැණවත් ලෙස එහි කටයුතු සංවිධානය කිරීමට අපූර්ව ශක්තියක් තිබුණි. ආගන්තුක වටපිටාවක දී මුහුණ දීමට සිදුවන ගැටලු සාර්ථක ලෙස විසඳ ගැනීමේ ශක්තිය ඇයට ලැබුණේ ඇයගේ පියාවන ධනංජය සිටුතුමාගේ ආවවාදවලට අනුගත වීමෙනි. මයිලණුවන්ගේ නිවසට යන දියණියට සිය පියාගෙන් ලැබුණු එම අවවාද යුග ජීවිතය ගැටුමින් තොර ව සාමකාමී ලෙස පවත්වාගෙන යාමට මහත් සේ උපකාරී විය. “පතිකුලයෙහි ආචාර ධර්ම“ ලෙස හැඳින්වෙන දස අවවාදය මෙසේ ය.

**ඇතුළත ගිනි පිටත නොදිය යුතු ය.**
**පිට ගිනි ඇතුළට නොගත යුතු ය.**
**දෙන්නාට ම දිය යුතු ය.**
**නො දෙන්නාට නොදිය යුතු ය.**
**දෙන්නාටත් නොදෙන්නාටත් දිය යුතු ය.**
**සැප සේ ඉඳගත යුතු ය.**
**සැප සේ කෑ යුතු ය.**
**සැප සේ නිදිය යුතු ය.**
**ගිනි පිරිමැසිය යුතු ය.**
**ඇතුළත දෙවියන් නැමදිය යුතු ය.**

(මේ පිළිබඳ වැඩි විස්තර සඳහා විශාඛා වස්තුව කියවන්න)

විශාඛා චරිතය තුළින් පිළිබිඹු වන පරමාදර්ශී ලක්ෂණ සමාජයට ඉදිරිපත් කිරීමෙන් ඒ පිළිබඳ තරුණ පරපුරේ නිසි අවධානය යොමු කරවීම අද යුගයේ අවශ්‍යතාවයකි. සෝවාන් බව පිළිබඳ ව විවාදාපන්න වන මෙ සමයෙහි පුද්ගල චරිත ලක්ෂණතුළින් එය අවබෝධ කර ගැනීමට ජනතාවට මඟ පෙන්වීම බෞද්ධ උගතුන්ගේ අරමුණ විය යුතු ය.

පුද්ගල චිත්ත සන්තානය තුළ නිසගයෙන් පවතින අගුණ දුරු කර යහපත් ගුණාංග වර්ධනය කර ගනිමින් තමාටත්, සමාජයටත් වැඩදායි පුද්ගලයන් සකස් කර ගැනීම සඳහා විශාඛා චරිතයෙන් කෙරෙන මඟ පෙන්වීම සර්වකාලීන ය. සර්වදේශී ය. ඒ පිළිබඳව තවදුරටත් කියවා, සිතා විමසා බලා ශක්ති පමණින් යහපත් ගති පැවතුම් තම තමන් තුළ වර්ධනය කර ගැනීමට උත්සුක වීමටත්, බෞද්ධ ප්‍රතිපදාව සමජය තුළ ක්‍රියාවට නැංවීමටත් සක්‍රිය දායකත්වය එමඟින් ලබා දිය හැකි වේ.

දර්ශන ශූරී බෞද්ධ අධ්‍යයන
මල්ලිකා කරුණාරත්න



# තමන්ගේ ජීවිතයට හැමෝම ආදරෙයි

පසුගිය බුදුසරණ පුවත්පතින්, ඒ කියන්නේ වප් පුර පසළොස්වක පෝදා පුවත්පතින් අපි සිද්ධාර්ථ කුමරුගේ යහළුවෙක් හංසයකුට විද බිම දැමූ සැටිත්, කුමාරයා හංසයා බේරා ගත් සැටිත් කියවූවා මතකයි නේද? ඉතින් සිද්ධාර්ථ කුමාරයා ළඟ ඉඳලා හංසයා ඉගිලී යන හැටි මේ යාළුවා දැක්කා.

එයාට හොඳටම කේන්ති ගියා. එයා කුමාරයා ළඟට දුවගෙන ආවේ මෙයාට මං හොඳ පාඩමක් උගන්වනවා කියලා හිතාගෙනයි. මං බිම දාපු හංසයා බේරලා ඇරියා කියලා මහ හඬින් කෑගහනවා.

සිද්ධාර්ථ ඔබ කළේ වැරැද්දක්. හංසයා බිම දැම්මේ මම. මමයි එයාගේ අයිතිකාරයා


යහළුවා දත්මිටි කකා රව රවා කෑගහන්න ගත්තා. කලබලේ මොකක්ද බලන්න අනිත් යහළුවොත් එතෙන්ට ආවා.

මේ සිද්ධාර්ථ මගේ හංසයා අල්ලාගෙන යන්න ඇරියා. එයා මොකටද එහෙම කළේ, යහළුවා අනිත් යහළුවන්ට නඩුව කිව්වා.

හංසයා ඔබට අයිති නැහැ. මට අයිතිත් නැහැ. ඒ නිසා අසරණ සතා මරන්න ඔබට අයිතියක් නැහැ. එයාගේ ජීවිතය අයිති එයාට. ඒ ජීවිතය ආරක්ෂා කරලා දුන්නා මිසක් මං එයාව අයිති කර ගත්තේ නැහැ. ඔබ කැමතිද කවුරු හරි ඔබේ අතපය කපලා කොටලා මරා දානවට. සැම දෙනාම තමන්ගේ ජීවිතයට ආදරෙයි. මගේ හොඳ මල්ලී සංසුන් වෙන්න. කේන්ති ගන්න හොඳ නැහැ. කියලා කුමාරයා කිව්වා. අනිත් යහළුවෝ හැම දෙනාම සිද්ධාර්ථ කුමාරයා කියන්නේ ඇත්තක් කියලා පිළිගත්තත් හංසයාගේ අයිතිය ඉල්ලපු යහළුවා ආයෙත් කෑගහන්න පටන් ගත්තා. යහළුවෝ දෙන්නෙක් එයාව වෙන පැත්තකට ඇදගෙන ගියා.

## ලොවට පිපෙන මල්

02 කොටස



පුංචි දුවේ, පුතේ සිද්ධාර්ථ කුමාරයා මොන තරම් හොඳ දරුවෙක් ද කියලා ඔබට වැටහෙනවා නේද?


මිනිසුන් වගේ ම සතා සිව්පාවාත් තමන්ගේ ජීවිතවලට හුඟක් ආදරෙයි. ඒක නිසා තමයි බුදුපියාණන් වහන්සේ පුංචි දරුවන්ටත් සියලු සත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා දුකින් මිදෙත්වා කියන මෛත්‍රී භාවනාව උගන්වා තියෙන්නේ.

බුදුපියාණන් වහන්සේට ගෞරව කරන කිසිම දරුවෙක් කිසිමදාක සතෙක් මරන්නේ නැහැ. සතකුට හිරිහැර කරන්නේ නැහැ. තමන්ට පුළුවන් විදිහට කෑම ටිකක් වතුර ටිකක් දීලා බඩගින්න පිපාසය සංසිඳවනවා. අපිත්, අපට ඉන්නේ මොන තරම් හොඳ කරුණාවන්ත දරුවෝ ද කියලා හිතෙන කොට හිතේ ලොකු සතුටක් ඇති වෙනවා.

ප්‍රවීණ ලේඛිකා

**සෝමා ජයකොඩි**

# දරුවන්ට නොපෙනෙන දුර මව්පියන්ට පෙනෙනවා



**ඔබ මේ ලෝකයට බිහි කරලා, හදාවඩා පෝෂණය කරලා ලෝකය දකින්නට, ඒ ලෝකයේ සුව සේ ජීවත්වන්නට නුවණ පාදා දුන්නේ ඔබගේ අම්මයි, තාත්තයි බව කිසි දිනෙකත් අමතක කරන්න එපා. .**

ඔබ ලෝකයේ කොතැනක සිටියත් දෙපයින් නැඟී සිටිමින් ජීවත් වන්නේ ඔබේ මව්පියන් විසින් උපතේ සිට ලබා දුන් ශක්තිය නිසයි. තරුණ දුවේ, පුතේ ඔබට ද අද තරුණ හයිය සිතටත් ගතටත් පැමිණෙන්නට පෙර බිළිඳෙක් ව සිට යාන්තමින් නැඟිට ගන්නට හැකියාව ලැබෙන තුරු ඒ අම්මයි, තාත්තයි විඳි පීඩා මහමෙරක් වගෙයි.

යම් වූ ද තරුණ දරුවකුට මවයි, පියයි වෙනුවෙන් සුළු වූ උපකාරයක් හෝ කිරීමට සිත නැමෙන්නේ නැති වන්නට පුළුවන්. ඒත් සිතා බලන්න. ඔබ කුඩා කාලයේ ඔබට සිටගන්නට, ඇවිදින්නට හැකි වයසට පැමිණෙන තෙක් අම්මයි, තාත්තයි මොනතරම් නම් සතුටකින් හා ප්‍රීතියකින් ඔබ දෙස බලා සිටියා ද යන බව ඔබ දන්නවා ද? මගේ දරුවාගේ ඇස් දෙක හොඳින් පෙනෙනවා ද? දෙසවන් හොඳින් ඇසෙනවා ද? කතා කරන්නට හැකි වේ ද ආදී ලෙස සිතමින් බුදුරදුන්ගෙන්, දෙවියන්ගෙන් මොන තරම් ආශිර්වාද ඉල්ලන්නට ඇති ද?

අද ඔබට බොහෝ හිත මිතුරු පිරිසක් ඇති. ඔබට “මගේ“ යැයි පවසන්න පිරිසක් ඇති. ඒත් ඔබ මෙලොව එළිය දුටු දා සිට ජීවිතයේ මුලින් ම ඔය මුහුණට එබෙමින් “මගේ, මගේ“ යැයි හදවත පිරි සතුටකින් කතා කළේ ඔබගේ අම්මයි තාත්තයි මිස වෙන අන් කවර නම් කෙනෙක් ද? ගුණවත් වූ මව්පියන් තමන්ට නො පෙනුණ ලෝකය දරුවන්ට පෙන්වා දෙන්නට, තමන්ටත් වඩා ඉහළ අධ්‍යාපනයක් දරුවන්ට ලබා දෙන්නට උත්සාහ ගන්නවා. ඒ වගේ ම තමන්ගේ කුස නො පිරුණත් දරුවන්ගේ කුස පුරවන්නට අපමණ වෙහෙසක් දරනවා. ඒ වගේ ම තමන්ගේ ජීවිතයේ තමන්ට ලැබුණු දුක් වේදනා මගේ දරුවන්ට නම් ලැබෙන්නට එපා යැයි සිහිනෙන් පවා ප්‍රාර්ථනා කරනවා. තමන්ගේ දරුවා වෙනුවෙන් විඳින දුක් වේදනා අම්මාට කිසි ලෙසකත් දුකක් නොවේ. තමන්ගේ දරුවා වෙනුවෙන් උසුලන බර පියකුට බරක් නොවේ. දුවේ, පුතේ ඔබ උස් මහත්වන විට, ඔබ තරම් මවත්, පියත් නොදන්නවා යැයි නො සිතන්න. යම් විටක ඔවුන්ට වඩා ඔබ ඉහළ අධ්‍යාපනයක්, උගත්කමක් ලැබුවා විය හැකියි. එහෙත් ඔවුන් ඔබට වඩා පරිණත බවින් හා ජීවිත අත්දැකීම්වලින් ඉහළින් සිටින බව කිසිවිටෙකත් අමතක නොකළ යුතුයි. තම අත්දැකීම් තුළින් දුක් විඳ, රැකියා කරමින් දරුවන් හැදූ වැඩූ අයුරු කතා කරන විට “අපට ඕවා වැඩක් නැහැ“ යි පවසන්න එපා. ඒවාට නිගරු වන අයුරින් කතා කරන්න එපා. “එදා වගේ නෙමෙයි අද සමාජය වෙනස්“ යැයි පවසමින් සිත් රිදවන්න එපා. එයින් ඔබට අකුසල් රැස්වනවා.

පසු කාලයක ඔබට මවගෙන්, පියාගෙන් ගේ දෙර, මිල මුදල් ආදී මොනවා ලැබුණත්, නැතත් මේ මිහිතලය මත තම දෙපයින් නැඟී සිටින්නේ අම්මටත්, තාත්තටත් පින් සිදුවෙන්නට යි. මෙලොව පවත්නා ලෞකික වස්තූන් සැම දෙයක් ම තාවකාලිකයි, අස්ථිරයි. එය අපට තථාගත බුදුරජාණන් වහන්සේ ද මැනවින් ධර්මයේ පැහැදිලි කරදී තිබෙනවා. අප ජීවත් වන්නේ ඉතා කෙටි කාලයයි. ඒ කාලය තුළ මගේ කියා පොඳි බැඳ ගන්නට දඹර කරන්නේ, තරග කරන්නේ තාවකාලික වූ, අස්ථිර වූ දෙයක් නිසයි. මව්පිය සෙනෙහස හා සහෝදරත්වය කිසි විටකත් නැති කර නො ගන්නට කටයුතු කිරීමයි යහපත්. මව්පියන් තුළ යම් යම් අඩුපාඩු වේ නම්, ඒවා නිවැරැදි කර ගැනීමට නුවණින් කටයුතු කරන්නට ඕනෑ. ඔවුන් ශ්‍රද්ධාවෙන් අඩු නම්, ශ්‍රද්ධාව වර්ධනය කිරීමටත්, සිල්වත් බවෙන් අඩු නම් සිල්වත් මඟ යන්නටත් පෙන්වා දෙන්න ඕනෑ. ප්‍රඥාවෙන් තොර නම් ධර්මානුකූල ප්‍රඥාවට ළං කරන්න. දුවේ, පුතේ ඔබට මවට, පියාට උපස්ථාන කළ හැකියි. ඔබ මේ සියල්ල කළ යුතු වන්නේ මෛත්‍රී සිතිනුයි. අවඥාවෙන් නම් නොවේ. එවිට ගුණ නුවණින් යුතු මව්පියන් ඔබට හදවතින් ම ආශිර්වාද කරනු ඇති. දුවේ, පුතේ ඔබ ඉහළ අධ්‍යාපනයක්, විශාල ධනයක් ලැබ සමාජයේ කුමන තත්වයක සිටියත් මවගේ ත්, පියාගේ ත් දෙපා මුල වැටෙන්නට තරම් හිතක් ඇතිවීම ඉතා ම යහපත්.

ඒ වගේ ම මවගේත්, පියාගේත් ජීවිත අත්දැකීම් තුළින් ඔබට උපදෙස් හා අවවාද දෙන්නට පුළුවනි. ඒවා වැරැදි ආකාරයෙන් දකින්න, සිතන්න එපා. ඒ සියලු දේ කරන්නේ ඔබේ අනාගත ජීවිතය සැපවත් කිරීමේ අදහසින් මිස නපුරු අදහසකින් නම් නොවේ. මුළු ලොවම කඩා වැටුණත් ඔබගේ ගුණබර මවටත්, පියාටත් ඔබ සමඟ, හදවතේ පත්ලෙහි ම රැඳෙන්නට ඉඩ දෙන්න.

**දීපා පෙරේරා**

බුදු සරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

**වප් අව අටවක පෝදා 2021-10-28**

## දියුණුවේ දොරටු

"දියුණුව" ජීවිතය හා බැඳී පවතින, කවුරුත් කතාබහ කරන, සුලබ වචනයකි. ඒ සාමාන්‍ය මිනිස් ස්වභාවය වන්නේ ම ඉන්නා තැනින් අඩියක් හෝ ඉදිරියට යැම වන නිසා ය. අනෙක් අතින් මිනිසත්කමට අර්ථයක් එක් වන්නේ ද මිනිසා දියුණු වූයේ නම් ය.

දියුණුව යැයි කී පමණින් බොහෝ දෙනකු සිතන්නේ භෞතික දියුණුව ගැනය. සැප පහසු ගේදෙර, යාන වාහන, ඉඩකඩම්, මිල මුදල් ආදිය ගැනය. පටලවාගෙන ඇත්තේ ද එතැනම ය. තිවසේ පරිසරයෙන් පටන්ගෙන මුළු මහත් ලෝකය දක්වා විසිර පැතිර පිරිහීමේ ලකුණු පෙනෙන්නට තිබෙන්නේ ඒ වැරැදි ආකල්පය මත සිට වැඩි දෙනකු කටයුතු කිරීම නිසා ය. අඩුපාඩුවක් නැතිව, සුව පහසුව, ලස්සනට ජීවත් වන්නට භෞතික දියුණුව අත්‍යවශ්‍යය. එහෙත් එය දියුණුවේ එක් අංගයක් පමණි. ඊට එක් විය යුතු අනිවාර්ය අංගය ආධ්‍යාත්මික දියුණුවයි. උතුරා යන තරමින් සම්පත් ගොඩගැසී තිබුණ ද ආධ්‍යාත්මික දියුණුව නොවේ නම් ඒ පුද්ගලයා ඇතුළත හිස් , පරිහානියට ගිය තැනැත්තෙකි. එවැනි පුද්ගල එකතුවක දිස් වන්නේ පිරිහීමට ගිය සමාජයක ලකුණු ය.

ඒ වගේ ම ඇතැම් අය ආධ්‍යාත්මික ගුණ දහමින් පිරිපුන් ය. එහෙත් ජීවිතය ගෙන යන්නේ බොහෝ දුෂ්කරව ය. සම්පත් අවමය. නොදියුණු ය.

එහෙත් ගිහියන් ලෙස අප උත්සාහ ගත යුතු මේ දෙ අංශයේ ම දියුණුව ළඟා කර ගන්නට ය. ඒ සඳහා ගමන් කළ යුතු මාවත, දියුණුවේ දොරටු ලෙස බුදුරජාණන් වහන්සේ අපට මනාව පෙන්වා දී ඇත.

ඒ අනුව කායික නීරෝගී බව හා මානසික නිරෝගී බව ප්‍රධානය. ලෙඩවීම තුළ අරමුණු වෙත යැම අසීරු ය. ගේ දොර සාමාන්‍ය කටයුතුවල සිට අධ්‍යාපනය, රැකියාව ආදී කුදුමහත් කටයුතුවලට බාධාවකි. එය දියුණුවට බාධාවකි. එහෙයින් කයත්, මනසත් ලෙඩ නොවන තැනට වග බලා ගන්නට උත්සාහ ගත යුතු ය.

දියුණුවේ තවත් දොරටුවක් වන්නේ සීලයයි. එනම් කය වචනයෙහි සංවර බවයි. ගිහියාට පංච ශීලය අනුදැන වදාරා තිබෙන්නේ ඒ සංවර බව හික්මීම ඇති කිරීමටයි. තමන්ට වඩා ගුණ නුවණින් ඉහළ වැඩිහිටියන්ගේ අවවාද, අනුශාසනා ඇසීම, පිළිපැදීම දියුණුවේ ඊළඟ දොරටුවය. එය කුඩා කාලයේ සිට ම පුරුදු පුහුණු කළ යුතු ගුණාංගයකි. විශේෂයෙන් අද අපේ ඇතැම් පාසල් දරු දැරියන්, තරුණ දූ පුතුන් නොමගට වැටී ජීවිතය විනාශ කරගන්නේ, පරිහානියට ඇද වැටෙන්නේ එවැනි වැඩිහිටියන්ට ඇහුම්කන් නොදීම නිසා ය.

ඇසූ පිරූ තැන් ඇති බව ද දියුණුවට අත්‍යවශ්‍ය ය. දිළිඳුව ඉපදුණත් ටිකෙන් ටික දියුණුවීමට, හොඳ නරක තෝරා බේරා ගන්නට, අයහපත් සිතිවිලි පාලනය කර ගන්නට, යහපත් සිතිවිලි තව තවත් වර්ධනය කර ගන්නට එවැනි පුද්ගලයාට පහසු ය. දියුණුවේ තවත් දොරටුවක් වන්නේ ධර්මානුකූල බව ය. දැහැමි දිවි පෙවෙත තමන්ට ද අනුන්ට ද කරදරයක්, පීඩාවක් ගෙන දෙන්නේ නැත.

උත්සාහය, අනලස්බව දියුණුවට අත්‍යවශ්‍යය. පරිහානියට පත්වන්නේ, ඉන්නා තැනින් අඩියක් හෝ ඉදිරියට නොයන්නේ මෙවැනි ගුණාංග ගැන අල්පමාත්‍රයක දැනුමක් හෝ නොමැති පුද්ගලයා ය.

# මුදලට නොව මිනිසත්කමට මුල් තැන දෙමු

**සසර දුකින් පෙළෙන සියලු ලෝ සතුන් කෙරෙහි අපමණ මහා කරුණාවෙන් යුතුව ධර්මය දේශනා කොට වදාළ අප අමාමෑණී බුදු පියාණන් වහන්සේ පුද්ගලයාගේ දෙලොව දිවි මඟ අලෝකවත් කර ගැනීමෙහිලා හැම විට මඟ පෙන්වා වදාළ ආදර්ශවත් මහා ශාස්තෘවරයෙකි. ඒ අනුව අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයට අයත් "පඤ්චභෝගාදී" සූත්‍ර දේශනාව තුළ පුද්ගලයා ලද සම්පත්වලින් ගත යුතු ප්‍රයෝජන පිළිබඳ ඉතා කදිමට පෙන්වා දී ඇත.**



තථාගත බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් මහා විහාරයේ වැඩ වසන සමයෙහි දිනක් අනේපිඬු සිටුතුමා උන්වහන්සේ හමුවීමට පැමිණියේ ය. එහි දී උපයාගන්නා ධනය පරිභෝජනය හා එමගින් දිවිය පවත්වා ගෙන යා යුතු ආකාරය පිළිබඳව දේශනාකොට වදාළහ. ඉටු කළ යුතු යුතුකම් ද මනාව පෙන්වා වදාළහ. ධනය ඉපයීමේ දී දැඩි උත්සාහයෙන් හා වීර්යයෙන් දහදිය වගුරුවා උපයා ගත යුතු ය. එම ධනය තුළින් තමා ද සැප විඳිය යුතු ය. තමා සැප විඳින්නා සේ මව්පිය, අඹු දරුවන්, දැසි දසුන් ආදීන් පෝෂණය කළ යුතු ය. ඥාති මිත්‍රාදීන්ට සංග්‍රහ කිරීම ද ඉතා වැදගත් ය. ගින්න, ජලය, සොරු, රජු ආදී උපද්‍රව පැමිණි කල ඒවායෙන් මිදීමට නම් ධාර්මික ධනයෙන් ප්‍රයෝජනයක් ගෙන පැමිණි උවදුරු දුරු කළ යුතු බවත් පෙන්වා වදාළහ.

සිටුතුමාට මෙකී කරුණු දේශනා කිරීමේ දී දැහැමි ධනයෙන් තමා සතුටු වීම හා අනුන් සතුටු කිරීම ද සිදු කරන්නා සේ "බලි" හෙවත් යුතුකම් 05 ක් පඤ්චභෝගාදී සූත්‍ර දේශනාව තුළ උගන්වනු ලබයි. ඒවා නම්

| | | |
|---|---|---|
| **අතිථී බලි** | - | **ආගන්තුකයන්ට සැලකීම** |
| **ඥාති බලි** | - | **ඥාතීන්ට සැලකීම** |
| **රාජ බලි** | - | **රජයට අය බදු ගෙවීම** |
| **දේවතා බලි** | - | **තමාගේ ඉටු දෙවියන්ට පුද පූජා කිරීම හා** |
| **පුබ්බපේත බලි** | - | **මිය ගිය ඥාතීන්ට පින් දීම ය.** |

මෙම යුතුකම් ධාර්මික ධනයක් උපයා ගැනීම තුළ පුද්ගලයා සිදු කරන බව බුද්ධ දේශනාව මඟින් පැහැදිලිව පෙන්වා වදාරා ඇත. මෙකී කරුණු පෙන්වා දීම තුළ අනේපිඬු සිටුතුමා දැහැමින් ධනය උපයන්නා සේම තමන් ද ඒවා පරිහරණය කරමින් බොහෝ යුතුකම් ඉටු කරන බව ප්‍රකාශ කර සිටියේ ය. බුදු රදුන් දැහැමි ධනය ඉපයීම මෙන් ම ඒවා පරිහරණය කර ගත යුතු ආකාරය විවිධ අංශ ඔස්සේ පෙන්වා වදාළහ. අධාර්මික ක්‍රියාවන් මඟින් වෙන් වී පුද්ගලයා හැම විට ම ධනය උපයා ගත යුතු බව ධර්මයෙහි පෙන්වා දෙනු ලබයි. දිනෙන් දින අධාර්මික වෙමින් යන නූතනයට මෙම ඉගැන්වීම ඉතා කාලෝචිත වූවකි. මුදල ම මූලික කර ගනිමින් මිනිසත්කම වල් වැදී ඇති අද සමාජයෙහි මිනිසා පිරිහී ඇති බව නම් නොරහසකි. එලෙස පරිහානියට පත් වීමෙහිලා මූලිකම සාධකය වී ඇත්තේ ධනය, බලය ආදී විකෘති ආශාවන් පසු පස හඹා යැම නිසාවෙනි. තරගකාරී ජීවන රටාවකට හුරු වීමයි. ඒ නිසාම දැහැමි බව අමතක කොට කෙසේ හෝ ධනය උපයා ගැනීමට හා ඒවා පරිභෝජනය කරන්ට හුරු වී ඇත.

මේ නිසා සමාජය දිනෙන් දින විනාශය වෙත ගමන් කරයි. එහෙත් දහමෙහි සඳහන් වන්නේ

"ධම්මෝ හවේ රක්ඛති ධම්ම චාරී" ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා ධර්මය විසින් ම රකිනු ලබන බවයි. මෙම බුද්ධ අවවාදයට අනුගත වීම තුළ නූතන සමාජයෙහි විකෘති ආශාවන් පසු පස හඹා යමින් සිටින මිනිසා ඒ මඟින් ගලවා ගැනීමේ ප්‍රධානතම මාර්ගය වනු නියත ය. එහි දී ධාර්මික බව මූලික වන හෙයින් එතුළින් මුළු මහත් සමාජය ම යහපත් මඟට යොමු වනු ඇත. තථාගත බුදු පියාණන් වහන්සේ පෙන්වා වදාළ මෙම දේශනාවන් තුළින් අප දිවි මඟ අලෝකවත් කර ගන්නා සේ ම දැහැමි සාර්ථක දිවි පෙවෙතක් උදෙසා මාවත සකස් කර ගැනීම ද අතිශය වැදගත් වන්නකි. ඒ සඳහා අවැසි ශක්තිය හා දිරිය ධර්මයේ ආශාර්වාදය තුළින් ම ඔබ සැමට ලැබේවා 'යි මෙත් සිතින් පතන්නෙමු.

ගාල්ල ශ්‍රී ලංකා ධර්මදූත
මහා පිරිවෙනේ ආචාර්ය, ශාස්ත්‍රපති
**කනංකේ විජිත නන්ද හිමි**



# විනයගරුකව භික්ෂු ආකල්ප රැකගෙන සම්බුද්ධ ශාසනය බබළවන්න කටයුතු කරන්න

**උදාර පැවිදි දිවියක පියසටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ සියම් මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ විධායක කාරක සංඝ සභික හා සහකාර ලේඛකාධිකාරී දහම්පාසල් පිරිවෙන් භික්ෂු විශ්ව විද්‍යාල රාජ්‍ය අමාත්‍යාංශයෙහි නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රී රෝහණ සංඝ සභා මූලස්ථානය ඇතුළු විහාර ගණයේ විහාරාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත ගෝණදෙණියේ තපස්සී නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**අපේ නායක හාමුදුරුවනේ,**

**පුංචි කාලයේදී ම පැවිදිබවට පත්වුණ ඔබ වහන්සේ සුපේශල, ශික්ෂාකාමී යතීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් රෝහණ මහා සංඝ සභාවේ සහකාර ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ වගේ ම පිරිවෙන් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙනුත් විශාල ශාසනික කාර්යභාරයක් සිදුකරනු ලබනවා. ඒ පිළිබඳ අතීතාවර්ජනයක යෙදෙමින් සාකච්ඡාවට ප්‍රවේශයක් ලබා ගනිමු.**

ගෝණදෙණිය ශ්‍රී මහා විහාරාධිපති ගල්පොත්තයායේ පුඤ්ඤරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් සංසාරගත පුණ්‍යශක්තියට අනුව ගෝණදෙණිය තපස්සී යන උතුම් ශාසනික නාමයෙන් ගෝණදෙණිය ශ්‍රී මහා විහාරස්ථානයේදී පැවිදි ජීවිතයට ඇතුළත් වීමෙන් අනතුරුව පිරිවෙන් අධ්‍යාපනය සඳහා රෝහණ සංඝ සභා මූලස්ථානයට වැඩම කළා. එහිදී සියම් මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ නිර්මාතෘවර මහානායක පුරාවිද්‍යා චක්‍රවර්තී සාහිත්‍යශූරී දර්ශන විශාරද මහෝපාධ්‍යාය මහාචාර්ය කඹුරුපිටියේ වනරතනාභිධාන ශ්‍රීමත් මහානායක මා හිමිපාණන් වහන්සේගේ සෙවණේ, එම සංඝ සභාවෙහි මහා ලේඛකාධිකාරී ධූරය දරමින් වැඩ සිටි ඌරාපොල රතනජෝති විද්‍යායතනත පිරිවෙන් පරිවේණාධිපති අතිගෞරවනීය පොලොම්මාරුවේ හේමසිරි නායක මා හිමිපාණන් වහන්සේ යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලා යටතේ ඌරාපොල ශ්‍රී රතනජෝති පිරිවෙනේ අධ්‍යාපනය ලැබුවා. ශ්‍රීමත් මහානායක මා හිමිපාණන් වහන්සේ කෙරෙහි බොහොම ගෞරවයෙන් කටයුතු කළ නිසා කාලයාගේ ඇවෑමෙන් සංසාරගත පුණ්‍යශක්තියට මෙන් ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධාන උපස්ථායක ලෙස ඉතාමත් හොඳින් එම කාර්යභාරය සිදු කළා. එම කටයුතු ඉතාමත් මැනවින් ඉටුකිරීම නිසා පැහැදීමට පත්වුණ ශ්‍රීමත් මහානායක මා හිමිපාණන් වහන්සේ ගේ හා හේමසිරි මා හිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යවරයකු ලෙස උපසම්පදා ශීලයෙහි පිහිටවනු ලැබුවා. ඒවගේ ම මූලික පිරිවෙන් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපන දක්වාම ඌරාපොල ශ්‍රී රතනජෝති පරිවේණස්ථානයෙන් අධ්‍යාපන කටයුතු සිදු කළා. උසස් පෙළ විභාගය සමත් ව රුහුණු විශ්ව විද්‍යාලයෙන් විශේෂවේදී උපාධිය ලබාගෙන විවෘත විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධිය හැදෑරීමට කටයුතු කළා. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත් ,ශාස්ත්‍රපති උපාධියත් පාලි බෞද්ධ විශ්ව විද්‍යාලයෙන් ලබා ගැනීමට කටයුතු කළා.




හේමසිරි නායක මා හිමිපාණන් වහන්සේගෙන් පසුව රෝහණ සංඝ සභා මූලස්ථානයේ විහාරාධිපතිත්වයට පත් වුණා. ඊට ප්‍රථමයෙන් විධායක කාරක සංඝ සභික ධූරයටත්,පසුව විධායක සභාවටත් , සහකාර ලේඛකාධිකාරී ධූරයටත් පත්ව මේ දක්වාම රෝහණ සංඝ සභාවේ සහකාර ලේඛකාරධිකාරී ස්වාමීන් වහන්සේ ලෙස රෝහණ මහා සංඝ සභාවේ සියලු උපසම්පදා විනය කර්මවලට සහභාගිවෙමින් වගකීම් දරමින් ශාසනික සේවයෙහි නියැළෙනවා. 2010 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් ශාඛාවෙහි සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හාමුදුරුවන් වහන්සේ ලෙස වැඩ භාරගෙන නැගෙනහිර පළාත, ඌව පළාත , කළුතරදිස්ත්‍රික්කය, දකුණු පළාත අදී වශයෙන් පළාත් කිහිපයක ම සේවය කිරීමෙන් අනතුරුව වර්තමානය වන විට අධ්‍යාපන අමාත්‍යංශයේ ද්විභාෂා හා සීලමාතා අධ්‍යාපන ආයතන භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ වශයෙන් කටයුතු කරනවා.

**ශාසනභාරධාරී නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් ඔබ වහන්සේට පැවරී තිබෙන්නේ මොනවගේ කාර්ය භාරයක්ද? අපේ හාමුදුරුවනේ,**

ශාසනභාරධාරී හාමුදුරුවන් වහන්සේ නමක් වශයෙන් ශ්‍රී රතනජෝති විද්‍යායතන පිරිවෙන, මා විසින් ආරම්භ කරන ලද වනරතන මූලික පිරිවෙන යන පරිවේණස්ථාන දෙකෙහි ම භාරකාරත්වය පැවරී තිබෙනවා. පැවිදි ශිෂ්‍යයන් වගේම ගිහි ශිෂ්‍යයන් විශාල පිරිසක් අධ්‍යාපනය ලබනවා. රෝහණ සංඝ සභාවෙහි උපසම්පදා පුණ්‍යෝත්සව ඇතුළු විධායක කාරක සංඝ සභික රැස්වීම්වල සියලු වගකීම් සහගත කාර්යභාරයන් පැවරී තිබෙනවා.

ඊට අමතරව විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙහි දහම්පාසල් පිරිවෙන් භික්ෂු විශ්ව විද්‍යාල රාජ්‍ය අමාත්‍යාංශයෙහි නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ නමක් ලෙස පිරිවෙන් සංවර්ධනය උදෙසා විශාල කැපකිරීමක් සිදුකරනවා වගේම රෝහණ සංඝ සභා මූලස්ථානයේ සංවර්ධන කටයුතු විශාල ප්‍රමාණයක් මේ වන විට සිදුකර තිබෙනවා. පහළ විජයල ශ්‍රී විජයාරාම විහාරස්ථානය හා අකුරුගෙඩ ශ්‍රී සමරනායකාරාම විහාරස්ථානය යන විහාරස්ථාන මගේ අධීක්ෂණය යටතේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා විසින් ශාසනික කටයුතු හොඳින් සිදුකරගෙන යනවා.

ගමේ දායක පින්වතුන්ගේ කුදු මහත් දායක කටයුතු සිදුකරමින් ප්‍රදේශයේ මහා සංඝරත්නයේ කටයුතු වෙනුවෙන් දායකත්වය ලබා දෙනවා.

**පිරිවෙන් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් පිරිවෙන් ක්ෂේත්‍රය තුළින් ලබාගත් අත්දැකීම් අනුව අපේ පුංචි හාමුදුරුවන් වහන්සේලාට ලබාදෙන අනුශාසනා මොනව ද? නායක හාමුදුරුවනේ,**

විනයගරුක ශික්ෂාකාමී හාමුදුරුවන් වහන්සේ නමක් වශයෙන් හොඳින් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබාගෙන මේ රටටත් සම්බුද්ධ ශාසනයටත් විශාල සේවාවක් සිදු කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම පොඩි තැනක සිට මේ තැන දක්වාම ඉදිරියට ගමන් කිරීමට අපට පිළිසරණ වුණේ අපි අධ්‍යාපනය ලබාගත් පිරිවෙන. පිරිවෙන නිසා තමයි අපි මේ සියලු කටයුතු සිදුකරන්නේ. අපේ පොඩි හාමුදුරුවන් වහන්සේලාට සිහිපත් කරන්නට තිබෙන්නේ පාලි සංස්කෘත ඇතුළු ප්‍රාචීන අධ්‍යාපනය ලබමින් ප්‍රාචීන පණ්ඩිත, රාජකීය පණ්ඩිත උපාධිය හදාරමින් විශේෂයෙන් ප්‍රාචීන උගතකු විය යුතු බවයි. විශ්ව විද්‍යාල උපාධියකට වඩා ප්‍රාචීන,රාජකීය පණ්ඩිත උපාධියට මේ රටේ තවමත් විශාල පිළිගැනීමක් තිබෙනවා. එනිසා හොඳින් පිරිවෙන් අධ්‍යාපනය ලබා ගෙන සම්බුද්ධ ශාසනයට හොඳ යතිවරයෙක් වන්න කියන පණිවුඩය තමයි ලබාදිය යුතුව තිබෙන්නේ. හොඳින් අධ්‍යාපනය ලැබුවොත් ශාසනය තුළ ඉහළම තැනට යාමට අවස්ථාව තිබෙනවා.

මට මේ සියලු වරප්‍රසාද ලැබීමට හේතු වුණේ පැවිදිවීමත් ශාසනයේ විනයකර්ම භික්ෂුවක් ලෙස කටයුතු කිරීමත් ආදී සියලු කාරණා නිසයි. විනයගරුක ව භික්ෂූ ආකල්ප රැකගෙන ශාසනය බබළ වන්න කටයුතු කරන්න. පිරිවෙන් අධ්‍යාපනය හොඳින් ලබාගැනීම අවශ්‍යයයි.

**හේමමාලා රන්දුනු**

# වරදක දී දරුවන්ට දඬුවම් කිරීම හරි ද වැරැදි ද?

**එක්තරා පියෙක් තම දරුවාට පාඩම් වැඩ කරන ලෙස දැන්වූ ව ද එය නොකළ නිසා දඬුවම් කළේ ය. පහර වැරැදී හිසට වැදීම නිසා දරුවා මරණයට පත් විය. පියා පහර දුන්නේ සත්භාවයෙනි. එම නිසා ම මේ සිදුවීම සාධාරණය කිරීම උදෙසා ඇතැම් අය ධර්මය සමඟ ගළපා ගන්නට උත්සාහ දරනු පෙනේ.**

කර්මය තුළ දී, චේතනාව කර්මය වන බවත්, (චෙතනාහං භික්ඛවේ කම්මං වදාමි චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචා මනසා)

චේතනාව යහපත් වුවොත් එය යහපත් ක්‍රියාවක් වන නිසා මෙය සාධාරණී කරණය කිරීමට පෙළඹේ. මෙහි දී ප්‍රාණඝාත අකුසලයකට සම්පූර්ණ විය යුතු සතකු වීම, සතකු බව දැන ගැනීම, මැරීමේ චේතනාව, මැරීම සඳහා උපක්‍රම භාවිතය ආදී කාරණාවන්ගෙන් මැරීමේ චේතනාව නොවූ බව ඔවුහු කියති. මෙය සාවද්‍ය කාරණයකි. යම් කර්මයක් සිදු වුවහොත් ඊට අදාළ ප්‍රති විපාකයක් වෙයි. අපගේ පින්තූරයක් ගත් විට අප වගේ වන්නා සේ කළ කර්මයෙහි ප්‍රති විපාකය ද ඒ හා සමාන වෙයි. ප්‍රති විපාක දෙකකි. ඒ ප්‍රවෘත්ති විපාක හා ප්‍රතිසන්ධි විපාකයි. ප්‍රතිසන්ධි විපාක යනු ඊළඟ භවයක උපතයි. සමහර විටක ඉහත සිදුවීමේ දී චේතනාව නොමැති විය හැක. එනමුත් ප්‍රවෘත්ති විපාක ලැබෙයි. චක්ඛුපාල තෙරුන් සක්මන් භාවනා කරද්දී නොදැනුවත් ව මෙරු මැරෙති. උන්වහන්සේ රහත් වූ නිසා ප්‍රතිසන්ධි විපාකයක් නොවිණි. එනමුත් ප්‍රවෘත්ති විපාක ලැබිණි. මහා කපි ජාතකයෙහි වළෙන් ගොඩ ආ මිනිසා තමා ගොඩ ගත් වඳුරා මරා මස් කන්නට ඌට ගලකින් ගැසී ය. කුසගින්න නිසා කළ දෙයකි. එහෙත් මේ මිනිසා මැරෙනා තුරු කුෂ්ඨ රෝගයකින් පෙළුණි. මේ තමා කළ අපරාධයෙහි කර්ම ශක්තිය සංකේතවත් කරන අවස්ථාවකි.

දරුවාගේ මරණය හා ඔහු ගේ මරණය පියා අතින් සිදුවීම භව සංසාර කර්ම ශක්තියක් බව මෙම සිදුවීම සාධාරණය කරන පුද්ගලයෝ මතයක් ඉදිරිපත් කරති. මෙයත් සාවද්‍ය ප්‍රකාශයකි. කර්මය ඒ අයුරින් ම සිදුවීමට ඉඩ හැරීම බුදු දහම නොව බුදු දහම සිදු කරනුයේ මෙම කර්ම ශක්තිය වෙනස් කිරීමයි.





"අපගේ දරුවන් අනුකරණශීලීන් වන්නේ, නිර්මාණශීලීන් නො වන්නේ මෙම බියසුළු ගතිය පදනම් කරගෙන ය. කෙතරම් උගත්කම් ලැබුවත් අපට බොහෝ විට නිර්මාණශීලීන් නැත. ව්‍යවසායකයින් නැත. විද්‍යාඥයින් නැත. අලුතින් හිතන අය නැත. කුලියට වැඩ කරන නිවට බියසුළු සේවක පිරිසක් ඇත."



කර්මයට එසේ දිගට ම ක්‍රියාත්මක වීමට ඉඩ හැරියොත් කිසිවකුට කිසිදා නිවන් දැකිය නොහැක. මිනිස් ආත්ම භවයක් ලැබ ගති සම්පත්තිය උරුම කර ගැනීම, බුද්ධෝත්පත්ති කාලයක උපත ලබා කාල සම්පත්තිය උරුම කර ගැනීම, අංග සම්පූර්ණ මිනිස් ආත්ම භවයක් ලැබ උපධි සම්පත්තිය ලැබීම, යහපත, අයහපත අවබෝධ කර ගත හැකි ලෙස බුද්ධිමත් වීම තුළ පයෝග සම්පත්තිය ලැබීම කර්මය වෙනස් කර ගත හැකි ශක්තීන් ය. සියල්ල කර්මයට යටත් කරයි නම් දරුවන්ට ඉගෙනුම ලැබීමට උනන්දු කරවිය යුතු නැත. මන්ද කර්මය තුළින් ඔහුගේ අනාගතය තීරණය කරනු ඇත.

ලාංකීය සමාජය බෞද්ධ සමාජයකි. එසේ වුවත් ඒ බෞද්ධ ප්‍රතිපදාව අප තුළ නැත. දරුවන්ට, සිසුන්ට දඬුවම් කළ යුතු ය. ඒ තුළින් ම දරුවන් සුමඟට යන බව අප සමාජයෙහි වන මිථ්‍යාවකි. මෙය බුදු දහම නොව බමුණු දහමයි. කකාර කකාර හදන හොද්ද රස වන්නා සේ තල තලා හදන දරුවා යහපත් වන බව කියයි. මේ බමුණු මතය වේ. ආදරය කිරීම බොහෝ දෝෂ ඇති බවත්, දඬුවම් කිරීම බොහෝ ඵල ගෙන දෙන බවත්, ඒ නිසා දරුවන් හා සිසුන් ආදරයෙන් නොහැදිය යුතු බවත් දඬුවමෙන් හැදිය යුතු බවත් බමුණෝ කියති.

("ලාලනෙ බහවෝ දෝෂා: තාඩනෙ බහවෝ ඵලං, තස්මාත් දාරස්ස ශිෂ්‍යයස්‍ය - තාඩයේත් මා ලාලයේත්.") මෙය කොතෙක් ව්‍යාප්ත වී ඇති දැයි කිවහොත් අධ්‍යාපනය හා ඈඳුන තවත් වචනයකි වේවැල,

**"වේවැල් කෝටු තාරං සියඹලා අතු - කිතුල් පොල් ඉරටු වල් කහබිලිය අතු - මෙවැනි ඉපල් මගේ දූතට නොපෑ යුතු - පමා නොවී එම් අකුරට මෙයින් මතු"**

අපේ පැරැන්නෝ කීවේ එසේ ය.

අතපය කඩලා හරි මට ළමයා හදලා දෙන්න යැයි සමහර මව්පියෝ කියති. මෙම මතවාදය තුළ සිටින අප සමාජය මව්පියන්ට, ගුරුවරුන්ට, දරුවන්ට හා සිසුන්ට දඬුවම් කිරීමට අයිතියක් ඇතැයි ප්‍රකාශ කරයි. එහෙත් ඒ තුළින් ඔවුන් නිර්මාණය කරනුයේ පෞරුෂ හීන දරුවන් බව නොතේරීම කරුමයකි. අද මව්පියන්ට, ගුරුවරුන්ට බිය ව යම් යම් කටයුතු කරන දරුවා හෙට දවසේ දී මහ සමාජයට පැමිණි විට වැඩ කරනුයේ බිය නිසා ය. තම සේවා ස්ථානයේ නිලධාරීන්ට බිය ය. දේශපාලකයන්ට බිය ය. ඔහු වැඩ කරනුයේ බියට මිස නිවැරැදි ව නොවේ. මෙවන් බියසුළු සමාජයක් බිහිවීම කවර අර්ථයක් ද?

අපගේ දරුවන් අනුකරණශීලීන් වන්නේ, නිර්මාණශීලීන් නො වන්නේ මෙම බියසුළු ගතිය පදනම් කරගෙන ය. කෙතරම් උගත්කම් ලැබුවත් අපට බොහෝ විට නිර්මාණශීලීන් නැත. ව්‍යවසායකයින් නැත. විද්‍යාඥයින් නැත. අලුතින් හිතන අය නැත. කුලියට වැඩ කරන නිවට බියසුළු සේවක පිරිසක් ඇත. පෞරුෂය බිද දමා හදන දරුවා රෝගියෙකි. මේ අයුරින් රටක් දියුණු කළ නොහැක.

ලංකාව බෞද්ධ රටකි. බහුතරය බෞද්ධ ය. එහෙත් අවාසනාවන්ත සිද්ධිය නම් බුදු දහම ඔවුන් තුළ නොමැත. ලාංකිකයා තුළ ආදරය නැත. පාරේ දී රියැදුරන් අතරින් වරදක් වූ විට සමාව ගැනීමක් නැත.





"ගසක් මල් ඵල හට ගැන්වීම බලහත්කාරයෙන් කළ නොහැක. එසේ වුවත් එම ගසට ජලය, බෙහෙත් පොහොර ලබා දෙමින් හොඳින් සාත්තු කරයි නම්, ගස හොඳින් වැඩෙයි. ගස හොඳින් වැඩුණු කල මල් ඵල හට ගනියි. මව්පියන්, ගුරුවරුන් දරුවන් වෙනුවෙන් අනුගමනය කළ යුත්තේත් මෙම ක්‍රම වේදයයි."

මානය ඇත. අනෙක් රියැදුරා අනේ ඔහුට වැරදුනා යැයි නොසිතයි. ඔහුට දෝෂාරෝපනය කරයි. වෛරය ඇත. සැමියා බිරිඳ අමතන්නේ, බිරිඳ සැමියා අමතන්නේ ආදර වදනින් නොවේ. "ඕයි" "තමුසේ" ආදි වදන් ය. මව්පියෝ දරුවන්ටත්, දරුවන් මව්පියන්ටත්, ගුරුවරු සිසුන්ටත්, සිසුන් ගුරුවරුන්ටත් මේ ආදි වශයෙන් සමාජයේ බොහෝ අය තුළ ආදරය නැත.

දරුවන්ට අධ්‍යාපනය දීම තුළ ඇත්තේ මව්පියන්ට තමන්ට ළඟා වීමට නොහැකි වූ ඉලක්කයට දරුවන් යොමු කිරීමයි. තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රයක් දරුවන් තුළින් ඉටු කර ගැනීමේ දී එය ඉටුනොවන අවස්ථාවක දී රාගය, ද්වේෂය, මෝහය, මානය, මදය වැනි නරක සිතුවිලි පහළ වෙයි. දරුවන් අධ්‍යාපනයට යොමු නොවූ විට දරුවන් කෙරෙහි වෛරය, කෝපය මතු වන්නේ මේ කරුණ මතයි. අභ්‍යන්තරය තුළ යහපත නම් පිට වන්නේත් යහපතයි. අභ්‍යන්තරය තුළ ඇත්තේ කුණු නම් පිටවන්නේ කුණු ය. මේ නිසා අප කළ යුත්තේ මේ අභ්‍යන්තරය යහපත් කර ගැනීමයි.

ගසක් මල් ඵල හට ගැන්වීම බලහත්කාරයෙන් කළ නොහැක. එසේ වුවත් එම ගසට ජලය, බෙහෙත් පොහොර ලබා දෙමින් හොඳින් සාත්තු කරයි නම්, ගස හොඳින් වැඩෙයි. ගස හොඳින් වැඩුණු කල මල් ඵල හට ගනියි. මව්පියන්, ගුරුවරුන් දරුවන් වෙනුවෙන් අනුගමනය කළ යුත්තේත් මෙම ක්‍රම වේදයයි. දෙමාපියන් දරුවන්ට ආහාරපාන ලබා දෙමින් දරුවන් පෝෂණය කළ යුතුයි. ආරක්ෂා කළ යුතුයි. ගුරුවරුන් දරුවන්ට ඉගැන්විය යුතු නැත. ඉගෙන ගැනීමට මඟ පෙන්වීම, පෙළඹවීම කළ යුතු ය. ආරක්ෂා කළ යුතු ය. මේ අයුරින් වූ විට දරුවන් නිසි වයසේ දී ඉගෙනීම සිදු කරයි. උගන්වද්දී බිහි වන්නේ අනුකරණශීලියෙකි. වහලෙකි. ඉගෙනුමට පෙළඹවීම තුළ ඉගෙන ගන්නා සිසුවා අලුතින් හිතයි. නිදහස් ව හිතයි. නිර්මාණශීලී ව හිතයි. දියුණු වන රටකට ඇවැසි එවන් වූ අයයි.

දක්ෂ අශ්ව දමනය කරන්නකු හා බුදුරජාණන් වහන්සේ අතර සංවාදයක් කේසි සූත්‍රයෙහි වෙයි. කේසී යනු අසුන් දමනය කරන්නෙකි. බුදුරදුන් ඔහුගෙන් අසුන් දමනය කරන අයුරු විමසයි. ඔහුගේ පිළිතුර වූයේ රළු අයුරින්, මෘදු අයුරින්, රළු මුදු දෙයාකාරයෙන් යන ක්‍රම යොදයි. එසේ දමනය නොවන්නෙක් වෙතාත් තම කීර්තිය උදෙසා එම අශ්වයා මරා දමයි.

බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරනුයේත් එසේ කටයුතු කරන බවයි. රළු අයුරින් දමනය කරයි. කය වචන සිත යන තිදෙරින් සිදු කරන වැරැදි කියයි. එහි විපාක වශයෙන් අපායගාමී ව විඳින පීඩාව කියයි. ඒ රළු ලෙස දමනය කිරීමකි. කය වචන සිත යන තිදෙරින් කරන යහපත කියයි. එහි විපාක වශයෙන් විඳින ස්වර්ග මෝක්ෂ සම්පත් කියයි. මේ දෙ අයුරම කියයි. ඒ ක්‍රම තුනින් ම දමනය නොවෙයි නම් ඔහුට අවවාද කිරීමෙන් වැළකෙයි. එය මරා දැමීමයි. බුදු රජාණන් වහන්සේට දමනය කළ නොහැකි පුද්ගලයන් දමනය කිරීමේ උතුම් ගුණය පැවතුණි. ඒ සඳහා උන්වහන්සේ තුළ පැවති ආයුධ නම් කරුණාව, දයාව, මෛත්‍රිය, ප්‍රඥාව යන ගුණයන් ය. උන් වහන්සේ ඒ තුළින් රජුන්, සොරුන්, මං පහරන්නන්, මිනීමරුවන් පමණක් නොව, යකුන්, බඹුන්, දෙවියන් වැනි අමනුෂ්‍යයන් මෙන් ම සතුන් ද දමනය කළහ. දෙමාපියන් හා ගුරුවරුන් සිසුන් හික්මවද්දී මේ ගුණවලින් හික්මවීම යෝග්‍යම ක්‍රමවේදය වේ.

අපේ දරුවන්ට දඬුවම් නොකරමු. ආදරයෙන්, කරුණාවෙන්, දයාවෙන් රැක බලා ගනිමු. නිවට බියසුළු රෝගී දරුවන් නොව උසස් පෞරුෂයෙන් යුතු දරුවන් හදමු.



උඩවේ සියම් මහා නිකයේ මහා ලේඛකාධිකාරී,
වැලිමඩ ගුරු මධ්‍යස්ථානාධිපති
ගුරු අධ්‍යාපනඥ සේවයේ කථිකාචාර්ය
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
ශාස්ත්‍රපති
අධ්‍යාපනපති
**විල්බය පඤ්ඤාතිලක හිමි**



## සේරුවිල මංගල මහ සෑයේ වැඩ සිටින

# අසිරිමත් ලලාට ධාතුන් වහන්සේ

**කවරයේ කතාව**

**භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ද්‍රෝණ අටක් ධාතුන් වහන්සේ රන් දෙනේ ඉතිරි විය. ඒ අතරේ සුදෝ සුදට රැස් විහිදුවමින් පුළුල් නළල් තලය වැඩසිටි සේක. මහාකස්සප මහරහතන් වහන්සේ මල්ල රජ දරුවන්ට වදාළේ භාග්‍යවතුන් වහන්සේගේ අධිෂ්ඨානය මත ලක් දෙරණේ සේරුවිල සමීපයේ අනාගතයේ පහළවන කාවන්තිස්ස රජතුමා විසින් මහා ස්තූපයක් ඉදි කරන බවත්, ඒ සෑ රදුන්ගේ මෙම ලලාට ධාතුන් වහන්සේ තැන්පත් වන බවත් ය.**

මල්ල රජදරුවන් ඒ කියමන පිළිගෙන ඉතාමත් හරසරින් ධාතුන් වහන්සේ කස්සප තෙරුන්ට ලබා දුන් අතර උන්වහන්සේ මහානන්ද තෙරුන්ට ලබා දී අනාගතයේදී ලංකා ධරණීතලයේ සේරුවිල අසල ඉදිවෙන මහා සෑයේ මේ ධාතුන් වහන්සේ තැන්පත් වන නිසා එතෙක් මේ ධාතුන් වහන්සේ රැක බලා ගන්නා ලෙස වදාළ සේක.

ඉන්පසු මහානන්ද තෙරුන් ඒ උතුම් ධාතුන් වහන්සේ විසල්පුර මහා වනයේ කූටාගාර ශාලාවේ ශාස්තෲන් වහන්සේ වැඩසිටි ගන්ධ කුටියේ වඩාහිඳුවා පුද පූජා පවත්වා උන්වහන්සේ පිරිනිවන් පානා විට තම ශිෂ්‍ය චන්ද්‍රගුප්ත තෙරුන්ට ධාතු වංශය පවසා පිරිනිවන් පා වදාළ සේක. චන්ද්‍රගුප්ත තෙරුන් වහන්සේ දෙව්රම් වෙහෙරේ දසබලයන් වහන්සේ වැඩ විසූ ගඳකිලියට වැඩමවා ධාතු පූජාව පවත්වමින් බොහෝ කල් වාසය කළහ.

උන්වහන්සේ පිරිනිවන්පාන විට තම ශිෂ්‍ය වූ භද්දසේන තෙරුන්ට ධාතු වංශය පවසා ධාතුන් වහන්සේ බාර කොට පිරිනිවන් පෑ සේක. භද්දසේන තෙරුන් වහන්සේ පිරිනිවෙන කල්හි තම ශිෂ්‍යවර ජයසේන තෙරුන්ට ධාතු වංශය පවසා ධාතුන් වහන්සේ භාර කළහ. ජයසේන තෙරනුවෝ ලලාට ධාතුන් වහන්සේ වේළුවන මහා විහාරයෙහි ශාස්තෲන් වහන්සේ වැඩ සිටි ගඳකිලියෙහි වඩා හිඳුවා සුවඳ මල් ආදියෙන් පූජා පවත්වා බොහෝ කල් වාසය කොට පිරිනිවන කල්හි තම ශිෂ්‍ය මහා සංඝරත්න තෙරුන්ට ධාතුන් වහන්සේ බාරදී ධාතුවංශය පවසා පිරිනිවන් පා වදාළ සේක. සංඝරක්ඛිත තෙරණුවෝ පිරිනිවන්පාන විට තම ශිෂ්‍ය වූ මහාදේව තෙරුන්ට ධාතු වංශය පවසා ලලාට ධාතුන් වහන්සේ භාර කොට පිරිනිවන් පා වදාළ සේක.

මහාදේව තෙරුන් ලලාට ධාතුන් වහන්සේ දෙවනපෑතිස් මහ රජුගේ සොහොයුරු මහානාග යුවරජු මාගම වාසය කරන කාලයේ හත්ථොට්ඨ නම් ජනපදයේ කුක්කුට පර්වතය අතරෙහි මහා සල් රුකක් සෙවණෙහි තබා අහසින් වැඩම කොට වන්දනා කළ සේක. ඒ උතුම් ධාතුන් වහන්සේ පිළිබඳ මහානාග රජුට ආරංචි විය. රජු ධාතුන් වහන්සේ සොයා ගෙන ගොස් "ස්වාමිනි, මටත් ධාතුන් වහන්සේ වන්දනා කරන්න අවසර දෙන්නැයි" ඉල්ලා සිටියේ ය.

මහානාග රජු සුවඳ පැනින් නා රාජාභරණයෙන් සැරසී ධාතුන් වහන්සේ වන්දනා කිරීමට පැමිණියේ ය. සුදු පාටින් රැස් විහිදවමින් ධාතුන් වහන්සේ වැඩ සිටි අතර ශ්‍රද්ධාවෙන් ඉපිලී ගිය රජු "ස්වාමිනි මට ධාතුන් වහන්සේ ලබා දෙන සේක්වායි" ඉල්ලා සිටියේ ය.

"රජතුමනි, අනාගතයේ පහළ වන කාවන්තිස්ස රජු නැගෙනහිර ප්‍රදේශයේ සේරුවිල සමීපයේ මේ ධාතුන් වහන්සේ තැන්පත් කර මහා සෑයක් ඉදි කරවන්නේ ය. එතෙක් ආරක්ෂා කරනු මැනයි" වදාළ සේක. රජතුමා එය රන්පතක ලියා ධාතුන් වහන්සේ රජ ගෙදරට වඩමවා මාළිගාවේ උත්තම ස්ථානයක ධාතුන් වහන්සේ තැන්පත් කරවීය.

කාලයකට පසු කාවන්තිස්ස රජු රජ විය. විහාරමහා දේවියගේ සොහොයුරු වූ චුල්ලපිණ්ඩපාතික තිස්ස තෙරුන් වහන්සේ කාවන්තිස්ස රජුගේ ආයුෂ දිව ඇසින් දුටු සේක. රජතුමනි, සෑයක් ඉදිකොට ධාතුන් වහන්සේ තැන්පත් කිරීමට කාලය මෙය යැයි වදාළ සේක.

ඉන්පසු මහා ස්තූපය ආරම්භ විය. ධාතුන් වහන්සේ තැන්පත් කරන සෑ ගර්භය ඉදිවෙමින් පවතී. එය ඉතාමත් මනරම් ය. ඒ ගර්භය දෙවැනි වූයේ රුවන්මැලි මහා සෑයේ ගර්භයට පමණි. රජතුමා විසින් බුද්ධ චරිතයේ සියලුම දේ සෑ ගර්බයේ රන්, රිදී, මුතු, මැණික් ආදියෙන් අඹවා සුන්දර කෙරුණි. මේ ගර්භය මැද විශාල මාණික්‍යයක් මත ස්වර්ණ පිළිම වහන්සේ නමක් තැන්පත් වුණි. ධාතුන් වහන්සේ තැන්පත් වන දිනයේ රහතන් වහන්සේලා නාග ලෝකයෙන් කේශ ධාතුන් වහන්සේ දෙනමක් වඩමවා ඇති බව ද සඳහන් වේ.

ධාතුන් වහන්සේ තැන්පත් වන දිනයේ රජතුමා තුන් වරක් සෑය ප්‍රදක්ෂිණා කර කරඬුව හිසේතබාගෙන අධිෂ්ඨානයක් කළේය. "ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගේ බුද්ධ ශාසනය බොහෝ කලක් සකල ලෝ සතට සෙත සලසන බව සැබෑ නම්, මාගේ ශ්‍රද්ධාව සැබෑ නම් මේ නව රියන් ප්‍රතිමා වහන්සේගේ ලලාට ධාතුන් වහන්සේ නළල් තලයේ පිහිටාවා!" ධාතුන් වහන්සේ ආකාසයට පැන නැංගාහ. බොහෝ දෙනා සාධුකාර දෙද්දී සුදුවන් රශ්මි දහරා නානා අයුරින් විහිදවමින් ප්‍රතිමා වහන්සේගේ තැන්පත් ව තිබූ ඌර්ණ රෝම ධාතුව ඉදිරියට මතු වී ලලාට ධාතුන් වහන්සේ නළලේ කිඳ බැසගත් සේක. අදටත් ඒ ආකාරයට ම ධාතුන් වහන්සේ පිහිටා ඇත. කේශ ධාතුන් වහන්සේ ද තැන්පත් විය. රහතන් වහන්සේලා පහන් දැල්වූහ. සුවඳ පැතිරුණේ ය. රහතන් වහන්සේලාගේ සෘද්ධි බලය සහ අධිෂ්ඨානයෙන් ඒ පහන් අදටත් දැල්වේ. ඒ සුවඳ අදටත් පැතිරේ.


**නයනා නිල්මිණී**

## ප්‍රහේලිකා අංක 21

බුදුසරණ

තෑගි අනුග්‍රහය බෞද්ධාලෝක පදනම

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**



### හරහට

01. ලක්දිවට බුදුසමය හඳුන්වා දෙනු ලැබුවේ දඹදිව විසූ මෙම ශ්‍රේෂ්ඨ අධිරාජ්‍යයා ය.
03. සතර මහා භූතයන්ගෙන් එකකි.
04. දෙමව්පියන් තම දියණියන් විවාහ කරදීමේ දී දෙනු ලබන තම වත්කම් කොටසයි.
06. අරළු, බුළු සහ නෙල්ලි සංයෝගය මෙනම් කසාය ලෙස හැඳින්වෙයි.
08. මෙම පදයෙන් ලජ්ජාව යන අදහස කියැවෙයි.
09. ජෛන ආගමේ කර්තෘවරයා මෙනමින් ද හැඳින්වෙයි.

### පහළට

01. බුද්ධ කාලයෙහි තිබූ සොළොස් මහ ජනපදයන්ගෙන් එකකි.
02. වීදුරු වළලු මෙනම් වළලු ලෙස ද හැඳින්වේ.
03. අබෞද්ධයන් සමග මේවා පැවැති අවස්ථා පහේ දී ම මිගෙට්ටුවත්තේ හිමියෝ බෞද්ධ පාර්ශ්වය මෙහෙයවී ය.
05. සිංහල රාජ සමයේ තිබූ උසස් පාලන තනතුරකි.
07. අටවිසි බුදුවරුන්ගෙන් එක් නාමයකි.
08. පූර්ණක නම් යක්ෂ සේනාධිපතියා ගැන කියැවෙනුයේ මෙම ජාතක කතාවෙහි ය.

**පිරුවානා පොත් වහන්සේ ඇතුළු වටිනා ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

## පෝය ලබන සහ ගෙවෙන අයුරු

| වප් අව අටවක පෝය | වප් අමාවක පෝය |
|---|---|
| ඔක්තෝබර් 28 බ්‍රහස්පතින්දා අපර භාග 12.49 අව අටවක ලබා 29 සිකුරාදා අපර භාග 14.09 ගෙවේ බ්‍රහස්පතින්දා සිල් | නොවැම්බර් 04 බ්‍රහස්පතින්දා පූර්ව භාග 06.03 අමාවක ලබා 05 සිකුරාද පූර්ව භාග 02.44 ගෙවේ. බ්‍රහස්පතින්දා සිල් |

# හරියටම දන්නේ නැතිව වරදකට දඬුවම් දෙන්නේ කොහොමද?

කුක්කුර ජාතකය

> කුණු කඳු ගොඩ ගැසුණු, පල් වතුර පිරුණු මේ ඇළ ඔස්සේ සුනඛයකුට එන්නට හැකි දැයි රාජ පුරුෂයකු යවා බලන්න රජතුමනි, එන්න බැහැ. කිසිවක් නො සොයා නො බලා පැනවූ නීතිය නිසා අහිංසක ජීවිත ගණනක් දැනටමත් විනාශවෙලා.

**මෙම කතාවේ මුල් කොටස වප් පුර පසළොස්වක පෝදා පුවත්පතේ පළවිය.**

හොඳයි රජතුමනි, මේ අපරාධය කළේ පිටිනුවර සුනඛයන්බව ඔබතුමා හරියට ම දන්නවා ද?"

රජු සබය දෙස බැලුවේ ය. ඇමතිවරු උඩ බිම බැලූ හ. පුරෝහිත බමුණා හිස කැසී ය.

"මූ නම් යකාගෙ සුනඛයෙක්" පුරෝහිත දත් මිටි සැපුවේ ය.

"පිටිනුවර සුනඛයන්ඔය අපරාධය කළ බව මා හරියට ම දන්නේ නැහැ –" රජු පිළිතුරු දුන්නේ ය.

"හරියට ම දන්නේ නැතිව වරදකට දඬුවම් දෙන්නෙ කොහොම ද? ඔබ තුමා ළඟ සිටින සුනඛයන්ගැන සැක කරන්න බැරිද?"

" ඒ අපේ මාළිගාවේ අප සමඟ සිටින අය. ඔවුන් ගැන අවිශ්වාසයක් නැහැ–"

"ඔබතුමා පක්ෂපාතිව තීරණ ගන්නවා – සමහරවිට ඔය අපරාධය කළේ ඔබතුමාගේ කීණ සුනඛයන්විය හැකියි."

"මා එසේ සිතන්නේ නැහැ.–"

"නොසිතන්නට සාධැරණ හේතුවක් තියෙන්න එපායැ?"

"හේතුවක් නම් නැහැ –"

"හරිම කනගාටුයි රජතුමනි, රාජ නියෝගයකට සාධාරණ හේතු තිබිය යුතුයි. නැත්නම් ජනතාවට රජුගෙන් යුක්තිය ඉෂ්ට වෙන්නෙ කොහොම ද? හේතු නැතිව පැනවූ මේ නියෝග අසාධාරණ බව මම ඔබතුමාට නැවතත් කියනවා."

"පිටිනුවර සුනඛයන්මෙය නො කළ බව ඔබට කිව හැකි ද?–"

"එහෙමයි රජතුමනි, රාත්‍රී කාලයේ පිටිනුවර කිසිවකුට මේ නුවරට ඇතුළුවීම අපහසුයි. මීයෙක් වුනත් එන්න ඕන තාප්පයට උඩින්–"

පුරෝහිතයා නැගිට්ටේ ය.

"රජතුමනි, පුරයේ සිට වතුර ගලා එන ඇළ මාර්ගයෙන් සුනඛයන්ට ඇතුළට එන්නට පුළුවනි"

"කුණු කඳු ගොඩ ගැසුණු, පල් වතුර පිරුණු මේ ඇළ ඔස්සේ බල්ලකුට එන්නට හැකි දැයි රාජ පුරුෂයකු යවා බලන්න රජතුමනි, එන්න බැහැ. කිසිවක් නො සොයා නො බලා පැනවූ නීතිය නිසා අහිංසක ජීවිත ගණනක් දැනටමත් විනාශවෙලා."

"නුඹ කියන්නේ මේ අපරාධ කළේ අපේ කීණ සුනඛයන්විසින් ය කියල ද?

"එහෙමයි–"

"ඔප්පු කළ හැකි ද?"

"එහෙමයි – මා එය ඔප්පු කරනවා – මෝරු වතුරත්, ඍතණ ටිකකුත්, දෙන්න–"

නරපතියා, සුනඛපතියාට ඒවා සැපයී ය.

"මෝරු වතුර සමඟ ඍතණ මුසුකොට ඔබතුමා ගේ සුරතලුන්ට – පොවන්න"

කීණ බල්ලෝ සඳුලු තලවලින් බැස රාජ සභාවට පැමිණියෙ හ.

උන්ගේ සාඩම්බර ගමන, ආඩම්බර බැල්ම සුනඛ නායකයාට පෙනිණ.

රාජ පුරුෂයෝ ඍතණ, මෝරු මිශ්‍රණය කීණ සුනඛයන්ට පෙවූ හ.

"අපි දැන් මේ ඇත්තන් සමඟ මාළිගා අංගනයට යමු–"

සුනඛපති, නරපතිට කී ය.

නරපතියා සිහසුනෙන් බැස්සේ ය. පුරෝහිත ද ,ඇමතිවරු ද, සෙනෙවිවරු ද ඔහු සමඟ මාළිගා අංගනයට ගිය හ. සුනඛ පතියා නරපතියා අසලට වී කීණ සුනඛයන්දෙස විමසිල්ලෙන් බලා සිටියේ ය.

එක් කීණ බල්ලෙක් ඔහ්... ඔහ්... හඬක් නැගුවේ ය. උගේ කට ඇරිණ – දිව එළියට වැටිණ.

තවත් සුනඛයන් කීප දෙනකුගෙන් ද ඒ හඬ ඇසිණ. උන් ගේ මුහුණුවල පීඩාකාරී රෝගී පෙනුමක් ඇතිවිය. පුරෝහිතයා සුනඛ නායකයා දෙස බැලී ය.

"නුඹ අපේ සුරතලුන්ට වස පෙව්වා". යන අදහස ඔහුගේ සිතට නැගිණ. දිවට නොනැගිණ.

එක් සුනඛයකුගේ කටින් සෙම ගුලියක් වැටිණ. ඒ සමඟ කළු පැහැති යමක් ද විය.

"අන්න රජතුමනි... අන්න..."

සුනඛපතියා නරපතියාට එය පෙන්වූයේ ය.

නරපති හිස බිමට නැඹුරු විය.

"සම් කැබැල්ලක්!"

පුරෝහිත මුහුණ රතු විය.

අනෙක් සුනඛයෝ ද සෙම ගුලි සමඟ සම් කැබලි පිටතට දැමූ හ.

පුරෝහිත බ්‍රාහ්මණයා රජු දෙස බැලී ය. රජුගේ මුහුණ කෝපයෙන් පිපිරෙමින් තිබිණ.

"ඒ කීණ සුනඛයන්නිසා උපන් කෝපයෙන් නොවෙයි. දැන් අප ද රාජ උදහසට ලක් විය හැකියි."

පුරෝහිතට සිතිණ.

යළි රාජ සභාව රැස්විය.

"සුනඛ නායකතුමන්ට අසුනක් පනවනු"යි රජු රාජ පුරුෂයකුට අණ කෙළේ ය.

"එපා රජතුමනි, අපට අසුන් නුහුරුයි.." කියමින් සුනඛපතියා බිම හිඳ ගත්තේ ය.

"ඔබ වෙසෙන්නේ කොතැන දැයි අසන්නටවත් මට බැරිවුණා" රජු සිහසුනේ හිඳගනිමින් කී ය.

"පිටිනුවර මහ සොහොනේ සුනඛයන් දහසක් සමඟ මා ජීවත් වෙනවා. ඔබ තුමා ඇති කළ භීෂණය නිසා පිටිනුවර සුනඛයන් ද දහසක් පමණ දැන් එහි සැඟවී සිටිනවා."

රජුගේ දෙතොල සැලෙනු ද, එහෙත් හඬ නො එනු ද සබයට පෙනිණ. රජ බිසව රන් කෙණ්ඩිය ගෙන ඔහුට පැන් ස්වල්පයක් පෙවුවා ය. රජු දෙතොල පිස සුනඛපතියා දෙසට හැරුණේ ය.

"ඔබ සිවුපාවකු වුව ද මේ සබයේ සිටින සියලු දෙනාට ම වඩා ඥානවන්තයි. මේ පුරෝහිත බමුණා මෙන් ම මාත් දිසාපාමොක් ඇදුරු තුමා ගේ ශිෂ්‍යයෙක් – අපි තක්ෂිලා උපාධිකාරයෝ – ඒත් ඔබ අපට අද වැදගත් ම පාඩමක් ඉගැන්නුවා. ඇත්ත යුක්ත සාධක සහිත ව පෙන්නුවා.



**ඉතිරි කොටස වප් අමාවක නොවැම්බර් 04 පත්‍රයේ පළවේ ...**

**දෙනගම සිරිවර්ධන**



නායක පදවිය වෙනුවෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීම

# නායක පදවි පිරිනැමීම හා සබැඳෙන ප්‍රාදේශීය බෙදීම්

"නුවර වැව, කලා වැව සහ පදවිය වැව යන වැව් තුනෙන් මායිම් වන ප්‍රදේශය නුවර කලාවිය යනුවෙන් ව්‍යවහාර කරනු ලබයි. උඩුනුවර, යටිනුවර, දුම්බර, හේවාහැට සහ හාරිස්පත්තුව යන රටවසම් පහ කන්ද උඩ පස් රට ලෙස ව්‍යහාරයට පැමිණ ඇත."



සන්නස්පත්‍ර ප්‍රදානෝත්සවය



නායක පදවිය සම්මත කොට ලිපියක් නිකුත් කිරීම



අනුනාහිමියන් විසින් පදවිය ස්ථිර කිරීම

## ලක්දිව සංඝරාජ පදවිය 9

**එක් එක් යුගවල දී රටෙහි පරිපාලන බෙදීම් අනුව ඒ ඒ කොට්ඨාස සඳහා නායක පදවි ඇති කිරීම කාලානුරූපී ව සිදු වී ඇති බව පෙනේ. නව පරිපාලන බෙදීම් සඳහා නව නායක පදවි ඇති වුව ද පැරැණි බෙදීම්වලට අනුකූල වන ලෙස පිරිනමන ලද නායක පදවි මේ දක්වා ද ඒ ඒ සංඝ මූලස්ථාන මඟින් පිරිනැමීම සිදු කරයි. නායක පදවි පිරිනැමීම හා සබැඳෙන ප්‍රාදේශීය බෙදීම් සඳහා මහා සිංහල ශබ්ද කෝෂය මගින් සපයා ඇති අර්ථ දැක්වීම් මතු දක්වා ඇත.**

කෝරළ - මහනුවර රාජධානි සමයේ වූ දිසාවකට අයත් පාලන කොට්ඨාසයක්, දිසාවනියක ප්‍රධාන කොට්ඨාසවලින් එකක්

පත්තු - කෝරළයකට අයත් කොටස්වලින් එකක් හෝ කෝරලය, පළාතක කුඩා කොටසක්

කඩවත් - මාර්ගයේ මුර කාවල් යෙදූ තැන, ප්‍රදේශයකට ඇතුළුවන තැන ඇති මුර පොළ

තොටමුණු - වරාය, වරායට ආසන්න ප්‍රදේශය

රට - (රාජ්‍යය යන අර්ථයෙන් නොවේ) දේශයක් ඇතුළත තිබෙන ජනපදය, දිස්ත්‍රික්කය, කෝරළය, ප්‍රදේශය

දිසා - පළාත, පළාතකින් කොටස

පළාත් - පරිපාලනය සහ යටත් කිරීම සඳහා රට කඩා වෙන් කරන ලද විශාලතම කොට්ඨාසය

එක් එක් වකවානුවල දී පරිපාලනමය පහසුව සලකා භූගෝලීය බෙදීම් වෙනස් කොට ඇති නිසා ඇතැම් විට එක් යුගයක දී එක් පළාතකට අයත් වූ කෝරළයක් තවත් යුගයක දී තවත් පළාතකට අයත් වූයේ යැයි සිතීමට අවකාශ ඇත. දැනට භාවිතයේ නොමැති නමුදු පැරැණි බෙදීම් කිහිපයක් මෙහිලා සඳහන් කිරීම වටී.

1910 වකවානුව වන විට කුරුණෑගල, පුත්තලම සහ හලාවත යනුවෙන් වයඹ පළාතෙහි දිස්ත්‍රික්ක තුනක් පැවතිය ද අද වන විට කුරුණෑගල සහ පුත්තලම යනුවෙන් දිස්ත්‍රික්ක දෙකක් පමණක් සලකුණු කර ඇත. සත් කෝරළය වශයෙන් මෙම ප්‍රදේශ ප්‍රසිද්ධියට පැමිණිය ද කටුගම්පල හත් පත්තුව, හිරියාල හත් පත්තුව, දඹදෙණි හත් පත්තුව, දේවමැදි හත් පත්තුව, වන්නි හත් පත්තුව, වැඋඩ විල්ලි හත් පත්තුව සහ දෙමළ හත් පත්තුව යන පත්තු කෝරළ වශයෙන් ව්‍යවහාර කළ බව පෙනේ. හලාවත දිස්ත්‍රික්කයෙහි පිටිගල් කෝරළය යනුවෙන් කෝරළයක් දක්වා ඇත. සත් කෝරළය සිංහල රජ යුගයේ සිට ම එම නමින් භාවිත වූ බව පෙනේ.

නූතන රත්නපුර දිස්ත්‍රික්කය කුරුවිට කෝරළය, නවදුන් කෝරළය, අටකලං කෝරළය, මැද කෝරළය, එතෙරවා (කඩවත) කෝරළය, දිග්ගම්පත (කුකුළු) කෝරළය සහ කොළොන්නා කෝරළය යනුවෙන් කෝරළ හතකට බෙදා තිබූ අතර එක් එක් කෝරළ පල්ලේ පත්තුව, උඩ පත්තුව, මැද පත්තුව ආදී වශයෙන් පත්තුවලට බෙදා දැක්විණි.

කෑගලු දිස්ත්‍රික්කය විමර්ශනය කිරීමේ දී සතර කෝරළය සහ තුන් කෝරළය යන පැරැණි කෝරළ බෙදීම් දෙකක් සහ උඩ සහ පාත බුලත්ගම් පළාත් දෙකක් පිළිබඳ කියැවෙයි. සතර කෝරළය ලෙස හැඳින්වෙන්නේ ගල්බොඩ කෝරළය, පරණකුරු කෝරළය, කිඳිගොඩ කෝරළය සහ බෙලිගල් කෝරළය යන කෝරළ සතර එක්වීමෙනි. තුන් කෝරළය ලෙස පනාවල්, ඇතුලුගම් සහ දෙහිගම්පල් යන කෝරළ තුන සලකනු ලබයි. නූතන සපරගමු පළාත පසුකාලීන නිර්මාණය වූවක් වන අතර ඉන් පෙර සපරගමු පළාතේ කොටස් බස්නාහිර සහ මධ්‍යම පළාත්වලට අයත් විය. සතර කෝරළයට අයත් පරණකුරු කෝරළය කොළඹට අයත් ලෙසින් සැලකෙන්නේ ද මෙයට අනුව විය යුතු ය. නුවර වැව, කලා වැව සහ පදවිය වැව යන වැව් තුනෙන් මායිම් වන ප්‍රදේශය නුවර කලාවිය යනුවෙන් ව්‍යවහාර කරනු ලබයි. උඩුනුවර, යටිනුවර, දුම්බර, හේවාහැට සහ හාරිස්පත්තුව යන රටවසම් පහ කන්ද උඩ පස් රට ලෙස ව්‍යවහාරයට පැමිණ ඇත. ගිංතොට, හිරිඹුර, දෙවට, කලේගාන යනුවෙන් ගාලු කඩවත් සතරක් පිළිබඳ තොරතුරු හමු වෙයි.

යම් කිසි ප්‍රදේශයක නායක පදවියක් හොබවන නාහිමිපාණන් වහන්සේ නමක අපවත් වීමෙන් හෝ එම නායක පදවියෙන් ඉවත් වීමෙන් එකී පදවිය පුරප්පාඩු වුවහොත් එම පදවිය හෙබවීමට අපේක්ෂා කරන හිමිපාණන් වහන්සේලා විසින් අදාළ ප්‍රදේශයෙහි වැඩ සිටින එම නිකායෙහි සහ පාර්ශ්වයෙහි වෙනත් වැඩිහිටි නාහිමිපාණන් වහන්සේලාගේ නිර්දේශ ලිපි සහිත ව ස්වකීය සංඝ මූලස්ථානය වෙත අයදුම්පත් ඉදිරිපත් කරනු ලැබේ. පළාතේ වැඩිහිටි මහා තෙරවරුන් වහන්සේලා සහ ගිහි දායක පිරිසක් සමග පැමිණ නායක පදවිය වෙනුවෙන් ස්වකීය යෝග්‍යතාව සඳහන් වන පරිදි සකස් කළ අයදුම් පත්‍රයක් සහ නිර්දේශ ලිපි මූලස්ථානය වෙත පිළි ගන්වයි. පාර්ශ්වයේ කාරක සංඝ සභාව විසින් එම අයදුම්පත් සහ නිර්දේශ ලිපි පරීක්ෂා කොට වඩාත් ම සුදුසු නාහිමිපාණන් වහන්සේ වෙත පදවිය පිරිනැමීම සම්මත කොට එම පදවිය පිළි ගැනීමට වැඩමවන ලෙස දන්වා සුදුසු ගෞරවාභිධාන සහිත ව පදවිය සම්මත කළ බවට මහ නාහිමියන්ගේ අත්සනින් ලිපියක් නිකුත් කරනු ලැබේ. වර්ෂ 1853 දී ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ඒ ඒ සංඝ සභාවන්ට පිරිනමන ලද බලතල ප්‍රකාර ව නායක පදවිය වෙනුවෙන් පිරිනමනු ලබන හිමිකම් ලියවිල්ල හෙවත් අක්ත පත්‍රයක් වන ශ්‍රී සන්නස්පත්‍රය සංඝ මූලස්ථානයේ දී මහෝත්සවයක් වශයෙන් පිරිනැමීම සිදු කරයි.

මෙම අවස්ථාවේ අභිනව නාහිමිපාණන් වහන්සේ විසින් සංඝ සභාව වෙත ප්‍රසාද පූජා පැවැත්වීම සිරිතකි. පාර්ශ්වයේ ලේඛකාධිකාරී හිමියන් විසින් සන්නස් පත්‍රය කියවූ පසු මහ නාහිමිපාණන් වහන්සේ විසින් සන්නස් පත්‍රය පිරිනමනු ලබයි. ඉන් පසු පදවිය ස්ථිර කිරීම යනුවෙන් අනුනාහිමිපාණන් වහන්සේලා විසින් ද එම සන්නස් පත්‍රය නැවත අභිනව නාහිමියන් වෙත පිරිනමයි.

***(ඡායාරූප සිතුල්පව්ව රජමහා විහාරාධිපති නාහිමියන් වෙත දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝ නායක පදවිය පිරිනැමීමේ විවිධ අවස්ථාවලිනි )***

**දිමුතු පුන්සර කොළඹගේ**



රණවිරුවන් වෙනුවෙන් කෘතගුණ දැක්වීම සඳහා ආරක්ෂක අමාත්‍යංශය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක බළකාය එක්ව ගඩොල් දෙකෝටි හැට ලක්ෂයක් යොදා ගනිමින් වසර 1770කට පසුව ශ්‍රී ලංකාවේ ඉදි කරන මහා සෑය වන "සඳහිරු සෑය" සඳහා තැන්පත් කිරීමට නියමිත කොත් වහන්සේ සහ චූඩාමාණික්‍යය රැගත් දර්ශනීය රථ පෙරහර 17දින උදෑසන දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හිඟුරාන නගරය වෙත ළඟා විය.මෙම චූඩා මාණික්‍යය සියැසින් දැක බලා වන්දනාමාන කර ගැනීම සඳහා ඓතිහාසික හිඟුරාන උත්තර ජයමහා විහාරාධිපති පූජ්‍ය හිඟුරාණේ සිරිධම්ම නායක හිමි, දමන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක ගලහිටියාගොඩ රතනසිරි හිමි ඇතුළු මහා සංඝරත්නය හා දමන ප්‍රාදේශීය ලේකම් උදාර චින්තන නානායක්කාර, දමන ප්‍රාදේශීය සභාවේ සභාපති මංගල මහින්ද ගුණවර්ධන, අම්පාර මානව හිමිකම් කොමිෂන් සභාවේ සම්බන්ධීකරණ නිලධාරි චන්ද්‍රසිරි විතානගේ සහ හිඟුරාන ග්‍රාම නිලධාරි රංජිත් අක්මීමන යන මහත්වරු ඇතුළු හිඟුරාන ප්‍රදේශවාසීහු විශාල පිරිසක් පැමිණ සිටියහ.

දමන සමූහ කේ.මෛත්‍රීපාල

## කඨින චීවර පූජාව

ඉබ්බාගමුව කඳුලව ඓතිහාසික මැදිරිය රජමහා විහාරස්ථානයේ වාර්ෂික කඨින චීවර පූජෝත්සවය මෙම 30/31 දෙදින සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් පැවැත්වීමට කඳුලව මැදිරිය රජමහා විහාරය, දන්තුරේ රජමහා විහාරය ඇතුළු තදනුබද්ධ විහාර ගණයේ විහාරාධිපති මහනුවර මල්වතු මහා විහාරවාසී දන්තුරේ විපස්සී නාහිමි ඇතුලු විහාරස්ථ දායක සභාව, සද්ධාසීල උපාසක සමිතිය, තරුණ බෞද්ධ සමිතිය තීරණය කර ඇත.

ඒ අනුව 30 වැනිදින රාත්‍රී 7.00ට ගොකරුල්ල කන්දේගෙදර පුරාණ විහාරාධිපති විචිත්‍ර ධර්ම කථික තුඹුල්ලේ පේමරතන ස්වාමින්ද්‍රයන් වහන්සේ විසින් කඨිනානිසංස ධර්ම දේශනාව පැවැත්වේ. 31 වැනිදින අලුයම 5ට කඳුලව ඉහළගම බුලත් ගෙදර එච්.එම්. දිනේෂ් තුසිත කුමාර මහතාගේ නිවසේ සිට කඨින වස්ත්‍රය විහාරස්ථානයට වැඩම කරවීමේ කෙටි පෙරහර සිදු කෙරේ. එදින දවල් මහා සංඝ රත්නය වැඩම කරවා පැවැත්වෙන මහා සාංඝික දානමය පින්කම හා කඨින චීවර පූජාව පවත්වා විහාරස්ථානයේ අපවත් වූ ස්වාමින් වහන්සේලාට හා සතර පේරුවේ මියගිය සියලු දායක දායිකාවන්ට පින් පැමිණවීම සිදු කෙරේ.

## පැවිදි බිමට



මීරිගම, ජයසුමනාරාමාධිපති, ශාස්ත්‍රපති අස්සජී හිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නයේ ආශිර්වාදයෙන් පසුගිය දා ධනංජය කුල දරුවා මාතර සාසන ධම්සර නමින් සසුන් ගත විය. පස්යාලේ දම්වල සාසනරතන භාවනායතනයේ ආශ්‍රමාධිපති විනයාචාර්ය ශාස්ත්‍රපති කෝට්ටේ සාසනතිලක හිමියෝ උපාධ්‍යයන් වහන්සේ වෙති.

## වචනය දෙපැත්ත ...

02 පිටුවෙන් ...

යම් වචනයක් වූ දෙයක්ය (භූත) , සත්‍යයක් ය, අර්ථ පිණිස පවතින්නක් යැයි දනියි ද, ඒ වචනය ද අනුන්ට අප්‍රිය අමනාප වේ ද, බුදුරජාණන් වහන්සේ ඒ වචනය ප්‍රකාශ කිරීමෙහි කල් දන්නේ වෙති.

යම් වචනයක් නොවූ දෙයක් ය (අභූත) , අසත්‍යයක් ය, අවැඩ ගෙන දෙන්නක් යැයි දනියි ද, ඒ වචනය ද අනුන්ට ප්‍රිය මනාප වේ ද, බුදුරජාණන් වහන්සේ එබඳු වචනය ද නොකියති.


යම් වචනයක් වූ දෙයක් ය (භූත) , සත්‍යයක් ය, අවැඩ ගෙන දෙන්නක් යැයි දනියි ද, ඒ වචනය අනුන්ට ප්‍රිය මනාප වේ ද, බුදුරජාණන් වහන්සේ එබඳු වචන ද නොකියති.

තථාගතයන් වහන්සේ, යම් වචනයක් වනාහී වූ දෙයක් ය (භූත) , සත්‍යයක් ය, වැඩ ගෙන දෙන්නක් යැයි දනියි ද, ඒ වචනය ද අනුන්ට ප්‍රිය මනාප වේ ද, ඒ වචනය ප්‍රකාශ කිරීමෙහි කල් දන්නේ වෙති.

කෙටියෙන් ම දක්වන්නේ නම් කොතරම් සත්‍යයක් වූව ද, එහි වටිනාකම පවතිනුයේ එය අන් අයට ප්‍රිය හෝ මනාප වීම තුළ නොව එම සත්‍යයෙන් පුද්ගලයකුට සිදුවන්නා වූ යහපත මතයි. ප්‍රියමනාප වචන තුළින් වංචා සහගත ලෙස කටයුතු කිරීමේ හැකියාව ද පවතී. යමකුට යහපත සැලසීම පිණිස ප්‍රිය හෝ මනාප වචන නොව ඇතැම් විට අප්‍රිය හා අමනාප වචන ද භාවිත කිරීමට සිදුවේ. අවසානයේ දී එම වචනයෙන් සිදු වන්නේ යහපතක් නම්, එය අන් අයට අප්‍රිය හා අමනාප වූව ද ගැටලුවක් නොවේ. චේතනාවේ පාරිශුද්ධත්වය සහ ප්‍රායෝගික ව ලබන ප්‍රතිඵලයෙහි සුවිශේෂීතාවය ම ප්‍රධාන වන බව ඉන් ගම්‍යමාන වේ.

තව කෙනකුට යහපත සිදුවන්නා වූ වචනයක් වුව ද, සුදුසු අවස්ථාවේ දී ප්‍රකාශ කිරීමෙහි ප්‍රායෝගික උපයෝගීතාවය ද පැහැදිලි වනුයේ ඉහත දැක්වූ සය ආකාර වචන භාවිතය තුළ බුදුරජාණන් වහන්සේ විසින් භාවිත කරනු ලබන ආකාර දෙකක් වූ වචන භාවිතය කල් දැන ප්‍රකාශ කරන වගට (කාලඤ්ඤූ) දැක්වීමෙනි. බුදුන් වහන්සේ සතු ව පැවති අප්‍රමාණ කරුණාව පදනම් කොටගෙන සසර සත්වයාට යහපත සැලසීම එකම අරමුණ වූ බැවින් වචනයෙහි ඉලක්කය සැමවිට ම යහපත කේන්ද්‍ර වූවකි. ඒ අනුව, යම් වචනයක් පැවසීමේ දී එහි ඵල විපාක පිළිබඳ ව අවධානය යොමු කිරීමෙන් තමාට හෝ පොදුවේ සමාජයට සිදුවන යහපත හෝ අයහපත පිළිබඳ ව වඩාත් පරීක්ෂාකාරීවීම කෙරෙහි සියල්ලෝ උත්සුක වේවා !

## බූටාවත්තේ සරණංකර හිමිගෙන් සමාජ සත්කාර සේවා



බූටාවත්තේ සරණංකර නා හිමි



සරණකංර පදනමේ නිලධාරී හිමිවරුන් ඇතුළු පිරිසක්

බුදු රජාණන් වහන්සේ දේශනා කළ ධර්ම මාර්ගයේ ගමන් කරමින් ශ්‍රී ලංකාවටත්, ලෝ වාසී ජනතාවටත් හැකි උපරිම සේවාවන් කරනු ලබන විදෙස්ගත ගරුතර භික්ෂූන් වහන්සේ නමකි මැලේසියාවේ ශ්‍රී ලංකාරාමාධිපති, සියම් මහා නිකායේ මල්වතු පාර්ශවයේ මැලේසියාවේ ප්‍රධාන අධිකරණ සංඝ නායක, ලෝක මහා කරුණා පදනමේ අධ්‍යක්ෂ ජෙනරාල් බූටාවත්තේ සරණංකර නා හිමිපාණන් වහන්සේ.

මැලේසියාවේ සිටින විශාල ශ්‍රී ලාංකිකයන් පිරිසකට සෙත සදන අතරේ, විවිධ පුද්ගලයන් විසින් ඉතාලිය වැනි රටවලට ගෙන යන බව පවසා අතරමං කර යන පිරිස්වලට ද උන් වහන්සේ සරණ වෙති. එසේම උන් වහන්සේ මෙරට ජනතාවට නිහඬ ව සිදු කරන ලද සේවාව අතිවිශාල ය. පාසල් දූ දරුවන්ගේ අධ්‍යාපනික උපකරණ ලබා දීම වෙනුවෙන් විශාල සේවාවක් උන් වහන්සේ විසින් සිදු කරනු ලැබූහ. උතුරේ සිට දකුණ දක්වා ම උන් වහන්සේගේ සේවාව විහිදී ගියේ ය.

වරෙක කිලිනොච්චියේ අසරණ දරුවන්ට පාසල් යෑමට පාපැදි ලබා දුන්හ. පාසල් උපකරණ ලබා දුන්හ. මෙවර ජාතික වෙසක් උත්සව දිනයේ නාගදීපයේ දූ දරුවන්ට අවශ්‍ය පාසල් උපකරණ ලබා දුන්නේ ද උන් වහන්සේගේ දාය කත්වයෙනි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලු පිරිවෙන්වලට අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් ලබාදීමට ද උන් වහන්සේගේ දායකත්වය ඉහළින් ම ලබා දුන්නේ පසුගිය මාසයේ දී ය.

එමෙන් ම කොවිඩ් 19 වසංගතයෙන් පීඩා විඳි මෙරට අතිවිශාල ජනතාවකට උන් වහන්සේ සරණ වූ හ.

ශ්‍රී ලංකාවේ මේ සේවාවන් සිදු කිරීම පිණිස උන් වහන්සේගේ නමින් ම සරණංකර පදනම නමින් සමාජ සේවා ආයතනයක් ද ස්ථාපිත කර තිබේ. ඒ හරහා පසුගිය දිනවල මෙරට රෝහල් උදෙසා පීසීආර් යන්ත්‍ර, ඔක්සිජන් සැපයීමේ යන්ත්‍ර ඇතුළු සෞඛ්‍ය උපකරණ රැසක් ද ලබා දෙන ලදී.

උන් වහන්සේගේ 68 වැනි ජන්ම දිනය නිමිත්තෙන් මේ මස 28 වැනි දා වත්තේගම මීගම්මන රාජමහා විහාරයේ දී ධර්ම දේශනයක් පැවැත්වීමට සරණංකර පදනම විසින් කටයුතු කර තිබේ. ඊට අමතර ව තවත් පින්කම් රැසකි. අපි උන් වහන්සේට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමු.

තාරක වික්‍රමසේකර

## දුටුගැමුණු මහ රජතුමා 52 කොටස

# විහාරමහා දේවියගේ නිශ්ශබ්දතාවය ගැටලුවක්

**කවුරුත් සන්නිපාත ශාලාවට පැමිණියහ. ඒ වන විට යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවේ සිටි සෙනෙවිවරු ද පැමිණෙමින් සිටියහ. වේළුසුමන දෙස කාගේත් නෙත් යොමු වුයේ "අද නම් අලුත් ආරංචියක් අරගෙන ඇවිත් "යන අදහසිනි.**

"මහ රජතුමා තවත් අඩ හෝරාවකින් පැමිණේවි. නන්දිමිත්‍ර මහා සෙන්පතිතුමා සාකච්ඡාව ආරම්භ කරාවි. දැනට උද්ගත වී ඇති අර්බුදකාරී තත්ත්වයයි සාකච්ඡාවේ අරමුණ" වේළුසුමන කීවේ ය.

සියලු සෙනෙවිවරු අසුන් ගත්හ. සැමගේ කුතුහලය "හෙට කුමක් වේවි ද " යන්නයි.

"මහා සෙනෙවිවරුනි, අප කවුරුත් උදාර අපේක්ෂා ඇතිව ගමන් කරන්නට සැලසුම් කර තිබූ අනුරාධපුර රාජධානිය සිංහලයන් යටතට පවරා ගැනීමේ සටන මදකට පමා කරන්නට සිදු වී තිබෙනවා. දුටුගැමුණු මහා රජතුමාට ඉතා අකමැත්තෙන් වුවත් යෙදෙන්නට සිදු වී ඇත්තේ වෙනත් සටනකයි."

"තමන්ගේ මව් බිසවත්, මංගල හස්ති රාජයාත් අමාත්‍ය මණ්ඩලයට පවා නොදන්වා ගෙන යාමෙන් තිස්ස කුමාරයා තමා කළ වරද පිළිගෙන ගැමුණු රජතුමාගේ ඉල්ලීම අනුව ඔවුන්ව එවීමයි කළ යුතුව තිබුණේ. නමුත් ඔහු ඉතා දඩබ්බර පිළිවෙතක් ගෙන තිබෙන්නේ අපේ රජතුමා සමග සටනකට එළඹීමේ කැමැත්තෙන් බව පෙනී යනවා."

මෙහිදී අපට ගැටලුවක් තිබෙනවා. ඒ මන්ද යත් දෙ සොහොයුරන් අතර සටනක දී කිසිවකුගේ පැත්තක් නො ගෙන මධ්‍යස්ත ව සිටින බවට දස මහ සෙනෙවිවරුන් ඇතුළු සේනාංක මහා සංඝ රත්නය හමුවී දී ඇති ප්‍රතිඥාවයි."

"තිස්ස කුමාරයා දැනටමත් ප්‍රතිඥා බිඳ දමා ඇති නිසා අප එම ප්‍රතිඥා බිඳ දැමීම වරදක් ද මහා සෙනෙවි තුමනි ?"

ගෝඨයිම්බර ප්‍රශ්න කළේ ය.

"ඔබේ තර්කය හරි, මහාසිව මහ තෙරුන් වහන්සේ ත්, ත්‍රිපිටකතිස්ස මහ තෙරුන් වහන්සේත් මේ ගැන සාකච්ඡා කළා. උන්වහන්සේලාගේ අදහස වූයේ එක් කෙනකු වරදක් කළ පමණින් අනෙක් අය වරදට පෙළඹීම වැරදි බවයි."

'නමුත් තිස්ස කුමාරයාට බාහිර යුද්ධ ආධාර ලැබෙනවා නම් අපට පැත්තකට වී සිටින්නට පුළුවන්ද ?"

ගෝඨයිම්බරගේ ප්‍රශ්නයට සියලු දෙනාම එකතු වුහ. නන්දිමිත්‍ර මද වේලාවක් නිහඬව සිට වේළුසුමන දෙස බැලීය.

'ඔබ සියලු දෙනාම හරි. එම තීරණයේ කිසිදු වරදක් නැහැ." වේළුසුමන කිවේ ය.

"මේ සටනේ දී පෙරමුණ ගැනීමට මම සූදානම්. නමුත් අපේ රජතුමා මහනුග්ගල දී එම ප්‍රතිඥාවට සම්බන්ධ වූ කිසිවකු මේ සටනට යොදා ගැනීමට කැමති නැහැ. ඒ නිසා හෙට ගමන් කරන මෙම සටනට එක් විය යුත්තේ එම ප්‍රතිඥා දිනයෙන් පසු අපේ සේනාංකවලට ඇතුළු වූ සෙනෙවිවරුයි."

"ඉතා විශාල බල හමුදාවක් ගෙන යාමට රජතුමාගේ බලාපොරොත්තුවක් නැහැ. සෙනෙවිවරු දස දෙනෙක්, දස දහසක බල ඇණියක්, පෙරමුණේ ගමන් කරන රජතුමාගේ ආරක්ෂාව සඳහා පන්සීය දෙනෙකුගෙන් සමන්විත අසරු සේනාවක් ගෙන යාමට සැලසුම් කර තිබෙනවා."

"හොඳයි, අස්හල භාර අස්හලයන්ට දැනටමත් අණ කොට තිබෙනවා අපේ අසරුවන්ට සුදුසු අසුන් පවරා දෙන ලෙසට. ඒ සියලු දෙනා හෙට හිරු උදාවත් සමග රාජාංගණය ඉදිරියේ රජමාවත දිගේ පෙළගැසී සිටිය යුතුයි."

"උදෑසන ආහාරය යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවෙන් සැපයෙනවා. දහවල් ආහාරය ගුත්තාගල යුද කඳවුරෙන් ලැබේවි."

වේළුසුමනගේ සැලසුම් කිරීම කාගේත් ප්‍රසාදයට හේතු විය. මෙයින් සිදුවන්නේ ඔහු තමන්ගේ ප්‍රතිඥාව බිඳ දැමීමක් නොවේදැයි ඇතැමුන්ගේ සිත් තුළ රැව් දුනි. එය වැටහී ගියාක් මෙන් නන්දිමිත්‍ර කතා කළේය.

මේ යුද්ධය වළක්වා ගැනීමට ක්‍රමයක් නැද්ද?"

"තිබෙනවා , මව් බිසවත් , කඩොල් ඇතුත් මාගමට එවීමට තිස්ස කුමාරයා කැමති කරවා ගැනීමෙන්."

"ඒ සඳහා යෙදෙන්නට කැමති සුදුසු කෙනකු අපේ ප්‍රභූන් අතර නැද්ද?"

"ඉන්නවා, කාම්බෝජ බ්‍රාහ්මණතුමා, උත්තර මහා ඇමති තුමා , නන්දිමිත්‍ර මහා සෙන්පතිතුමාට පුළුවන්. වේළුසුමනටත් පුළුවන්."

"ඇයි ඉතින් ඒ අය ඉදිරිපත් නොවන්නේ ?"

"මේ කාර්යයට අත ගැසිය යුතු ප්‍රධානම තැනැත්තිය විහාර මහා දේවි බිසොවුන් වහන්සේ යි. එතුමිය අත නොගසන තැනකට අත ගැසීමට කිසිවෙක් කැමති නැහැ."

"ඒක නම් ඇත්ත. කිහිප දෙනෙකු ම එකවර පැවසී ය. එහෙනම් මේ සඳහා වෙනත් උපදෙසක් අපට ලබා ගන්නට බැරිද?"

"දැන් දුටුගැමුණු මහා රජතුමා සමග ත්‍රිපිටකතිස්ස මහා තෙරුන් වහන්සේ වැඩම කරාවි. යුද්ධය නො කළ යුතු නම් උන්වහන්සේ උපදෙස් දේවි."

"මේ සටන ප්‍රධාන වශයෙන් මව් බිසොවුන් වහන්සේ උදෙසා නම්, එතුමිය ස්වේච්ඡාවෙන් ම මාගමට පැමිණියහොත් ගැටුම් නතර කර ගත හැකි නොවේද?"

"හොඳම විසඳුම එය තමයි. එහෙත් එතුමිය හමු වන්නට, අදහස් දැන ගන්නට ක්‍රමයක් නැහැ"


'අපේ චරපුරුෂ සේවය ඒ තරමට ම දුර්වල වෙලා ද?"

දෙඩමලුව සිටි සභාව නිශ්ශබ්ද කරමින්, දුටුගැමුණු මහරජතුමාත්, ත්‍රිපිටකතිස්ස මහා තෙරුන් වහන්සේත් පැමිණියහ. සියල්ලෝ ම නැගී සිටියහ. හිස නමා වැඳ නමස්කාර කළහ.

මහා තෙරුන් වහන්සේ වැඩහුන් පසු කවුරුත් අසුන් ගත්හ. සභාව මීයාට පිම්බාක් මෙනි.

මහ තෙරුන් වහන්සේ අනුශාසනාවට මුල පිරූහ.

> හොඳයි, අස්හල භාර අස්හලයන්ට දැනටමත් අණ කොට තිබෙනවා අපේ අසරුවන්ට සුදුසු අසුන් පවරා දෙන ලෙසට. ඒ සියලු දෙනා හෙට හිරු උදාවත් සමග රාජාංගණය ඉදිරියේ රජමාවත දිගේ පෙළගැසී සිටිය යුතුයි.



අයන්ති විතාන

## සාමය



වෙඩි හඬට හැප්පෙමින්
රක්ත රුධිරය හෙළන....
මළ සිරුරු මහ ගොඩක්
මිහිතලය වසාගෙන.....
දෙනෙත් බොඳ කර හඬන
සෝ සුසුම් දරා ගෙන........
ඉකිගසන හදවතට
අස්වැසිල්ලකි.........
සාමය............

**ඒ.එච්.චම්පිකා ජයමිණි**
11 බී ශ්‍රේණිය
ශ්‍රී ධර්මෝදය දහම් පාසල
මැතගම

## අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ




අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ පොසොන් පුර පසළොස්වක පෝදිනෙක ශ්‍රී ලංකාද්වීපයට වැඩම කළහ. ඒ තෙවැනි ධර්ම සංගායනාවෙන් පසු ලෝකයේ රටවල් නවයකට උතුම් වූ ශ්‍රී සද්ධර්මයේ පණිවුඩය පතුරුවා හැරීමේ තීරණයෙහි මාහැඟි ප්‍රතිඵලයක් ලෙසයි.

මිහිඳු මහ රහතන් වහන්සේ වැඩසිටි ගල්තලාව පා මුලින් තිස්ස රජතුමා මුවකු පසුපස හඹා ගියේ ය. එය දුටු මිහිඳු මහරහතන් වහන්සේ "තිස්ස, තිස්ස" නමින් ආමන්ත්‍රණය කළහ. මාගේ නමින් හඬ ගසන්නේ කවරෙක් දැයි රජතුමා හැරී බැලීය. මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ආර්යයන් වහන්සේලා දුටු රජු නුඹ වහන්සේලා කවරහු දැයි ඇසීය. මිහිඳු මහ රහතන් වහන්සේ අපි ධර්මරාජයන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු යැයි පිළිතුරු දුන්හ.

**සියඹලෑවේ රාහුල හිමි**
04 ශ්‍රේණිය
මූලික පිරිවෙන
දිවුල්දෙණිය

## ළමා ප්‍රහේලිකා අංක 26



**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**

### හරහට

1. මහාභද්‍ර කල්පයෙහි පළමුවන බුදුන් වහන්සේගේ නමයි
4. සංඝයා යන අරුත දෙන පදයකි
6. ඕල්කොට් තුමා ලංකාවට ගොඩබැස්සේ මෙම වරායෙනි
7. වරද කළ අයට මේවා පැමිණවීම පැරණි දඬුවම් ක්‍රමයකි
8. උඩරට නැටුම් ක්‍රමයෙහි දී ගායනා කරන මෙනම් ප්‍රබන්ධ දහඅටකි

### පහළට

2. පරලොව යහපත සඳහා පින්කම් කර මේවා රැස්කරගත යුතුය
3. සංඛ්‍යාවෙන් දෙකක්ය යන අරුත දෙන පදයකි
5. දඹදිව තිබූ සොළොස් මහ ජනපදයන්ගෙන් එකකි
6. වැඳුම් කිරීමේදී කියවනු ලබන පාලි පද්‍ය ප්‍රබන්ධය මෙනමින් හැඳින්වෙයි
7. මුගලන් හිමියන් මෙම පාර්ශ්වයට අනුගත ශ්‍රාවක ලෙස දක්වනු ලැබේ.

## කරුණාව

බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව කරුණාව හඳුන්වා දී තිබෙන්නේ "අන් අයගේ දුකේ දී යහපත් අයගේ හදවත කම්පාවීම කරුණා ගුණය ලෙස ය.

සාමාන්‍ය පුද්ගලයින්ගේ කරුණාව සීමිත එකක් වුව ද සුවිශේෂී කරුණාවක්, මහා කරුණාවක් බුදුරජාණන් වහන්සේ තුළ දක්නට ඇත. සියලු සත්වයන් කෙරෙහි සම සිතින් ක්‍රියා කිරීම බුදුරජාණන් වහන්සේගේ ලක්ෂණයකි. උන්වහන්සේ හිමිදිරි උදෑසන මහා කරුණා සමාපත්තියට සම වැදී තමන් වහන්සේගේ පිහිට ලැබීමට අද කවරකු සුදුසු වේ දැයි බලමින් ඔවුන් වෙත ගොස් පිහිටවූහ.

බුද්ධත්වයේ සිට පරිනිර්වාණය තෙක් වසර හතළිස් පහක් තුළ වැඩිම කාලයක් බුදුරජාණන් වහන්සේ ගත කළේ මිනිස් ප්‍රජාවට ලෞකික හා ලෝකෝත්තර දියුණුව සලසා දීමට ය. එම කාලය තුළ බුදුරජාණන් වහන්සේගේ පිහිට ලද්දෝ අප්‍රමාණ ය. ජීවිතය කලකිරී දිවි නසා ගැනීමට ගිය රජ්ජුමාලා, ලෙඩ වී සිටි පූතිගත්තතිස්ස තෙරණුවෝ, සොහොනේ මළ සිරුරක ගැට ගසා තිබූ සෝපාක, තම මළ දරුවා මරණයෙන් මුදවා ගැනීමේ අදහසින් නිවසක් නිවසක් පාසා ගමන් කළ කිසාගෝතමිය ඉන් අතළොස්සකි.

බුදුරජාණන් වහන්සේගේ චරිතය ආදර්ශයට ගෙන දුකට පත් පුද්ගලයාට මෙලොව දුකින් පමණක් නොව පරලොව දුකින් ද මිදීමට උපකාර කරන්නේ නම්, එය උතුම් මිනිස් ගුණයක් ලෙස අගය කළ හැකි ය.

**මහගම සුමේධ හිමි**
4 ශ්‍රේණිය
මහා විහාර මහා පිරිවෙන
මහනුවර



# සදහම් අරණ



සංස්කරණය - **නයනා නිල්මිණි**

## පැන විසඳුම්

දයාවංශ ජයකොඩි සහ සමාගම

**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

බුදුරජාණන් වහන්සේගේ කරුණාව
යන මාතෘකාව පිළිබඳ කෙටි රචනාවක්
නිර්මාණාත්මක ව ලියා අපවෙත එවන්න.
.......................................................................................


ජයග්‍රාහී දරුවකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පඬුරක් පිරිනැමේ.

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

**සම්පූර්ණ නම** :- .......................................................
**පාසල / දහම් පාසල** :- .......................................................
**ඉගෙනුම ලබන ශ්‍රේණිය** :- .......................................................
**ලිපිනය** :- .......................................................
**දුරකථන අංකය** :- .......................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.**

### පන්සලේ පිවිසුම



**රාජාංගනයේ සුමන ජෝති හිමි**
03 ශ්‍රේණිය
ශ්‍රී මහා මහින්ද පිරිවෙන - අනුරාධපුර

### ගමේ විහාරස්ථානය



**ඉෂාන් සංජය**
02 ශ්‍රේණිය
ප්‍රඥානන්ද මහ පිරිවෙන - මහරගම

### ධර්ම ශ්‍රවණය



**විදුන් සචිත්‍ර හේරත්**
08 ශ්‍රේණිය
සුවිශුද්ධාරාම දහම් පාසල - කොළඹ 06

### අපේ පන්සල



**ඉෂාර නයනක පීරිස්**
02 ශ්‍රේණිය
ශ්‍රී සුමේධ දහම් පාසල - විල්පත

## බුදුසරණ



රට තුළ පැණවුණා සීමා සං චරණ
සිත් තුළ ඇවිළුණා රෝ දුක් බිය මරණ
අම දම් ඔසුව නුඹ ම ය අප සිත් නිවන
පිහිටට හිටියෙ නුඹ පමණයි බුදු සරණ

නා හිමිවරුන්ගේ ගුණ නැණ දම් පුරණ
කවි කිවිඳියන් ලියූ සදහම් ගුණ පිරුණ
අකුරක් නැර කියවමි පෝදා වරුණ
රැකවරණය ම වේ අපහට බුදුසරණ

පිටුවෙන් පිටුව බුදු දම් ගුණ සඟ රුවන
සදහම් දහම් සැමදා එකලෙස බෙදන
බුදු මඟ හෙළි කරන්නට නිති වෙර දරන
බුදු සරණින් රැකේවා කල් බුදුසරණ

ළමා ලොවේ පිපෙනා සදහම් අරණ
පතුරාලමින් දස අත බුදු රැස් කිරණ
අටුවා ටීකා ගලපා නිති බණ දෙසන
මට නම් හිමි නමක් ම ය නිති බුදු සරණ

**මාලා විජේරත්න**
ගොහාගොඩ

## මවකගෙ ගුණ



එක පුත් සඳක් ලොව ගණඳුර කරයි දුරු
දිවියට බත බුලත සපයයි එකම හිරු
හිරු සඳු ලෙසට පිළිසරණ ය වෙන කවුරු
ලේ කිරි කර පොවා අප දිවි රැකි අයුරු

හඬා වැළපී කිසා ගෝතමී බුදුන් වෙත ආයේ
නිවා ශෝකය අමා දම් රස පොවා සැනසූයේ
සුසානේ සිටි සෝපාක වෙත කිසිවකුත් නාවේ
බුදුරදුන් මෙත් දයා ගුණෙනී හිතේ දුක නිවූයේ

ගල් බොරළු මැද බැබළි බැබළි මැණික දිලිසෙනවා
හස්තියන් මැද සුදු ඇතෙක් වෙත දෙනෙත් දිව යනවා
නියං සමයක කළු වළාවක් අහසෙ පාවෙනවා
කතුන් දහසක් අතර මවකගෙ ගුණය නො සිඳෙනවා

**අනුජ ජයවීර**
පස්සර පාර
හිඳගොඩ
බදුල්ල

## වෙසඟ සිරිසර

**මෙවර ජයග්‍රාහී නිර්මාණය**



මලින් මලින් පිබිදෙයි පරිසරය අගේ
තවමත් වැඩ වසයි රැක්මෙන් දෙවිඳුන් ගේ
පුද පෙත් ලබයි ලෝ වැසි බොදු මිනිසුන් ගේ
එ නිසයි රන් කොතින් බුදු රැස් පැන නැං ගේ

සවනක් රැසින් හැඩ වෙනවිට පුරවර ය
සිත් සන්සුන් ව කමටහනක පෙරහුරු ය
මුදුනත් බැඳි මුව මුව රැඳි පින්සර ය
සඳකැන් දිය ගලයි නහවා පරිසර ය

ඇති නැති බව මෙනෙහි කරමින් නොවන නිමා
පැතිරෙයි පින් සුවඳ බෝ පත් අතර හමා
මැතිරෙන විට දහම් පද වැල් සිරස නමා
බැති සිත ගලා යයි පන්සල් බිම ම තෙමා

**සිරි දන්තනාරායන**
මිරිජ්ජවිල
හම්බන්තොට



**සංස්කරණය - දීපා පෙරේරා**

## ඔබ පමණයි ළඟ

උපයා ගත් හැම සම්පත් මදින් මද දුරස් වේ
සෙනෙහෙවන්ත හැම දෙනා ම ඒ වාගෙ ම දුරස් වේ
සිතුම් පැතුම් රැස් දහරා නිමේෂයට අමතක වේ
මරණය ඔබ නොවරදවා දිනපතා ම ළඟට ම වේ

**කිතුල්ගල**
රත්නසේකර රූපසිංහ

## යා යුතු තැන



වෙනස් වෙවී රෝගය පැතිරී යද්දී
සමත් වෙවී ඇත පිළියම් යොමු වෙද්දී
දුරස් වෙවී නිති පිළිවෙත් සපුරද්දී
දුකින් තැවී කිම පින් කළ යුතු වෙද්දී

මරණය නියත වී ඇති බව අපි දනිමු
සහනය කොතැනක ද බැලුවත් නොම දකිමු
දහමය පවතින්නෙ ලොව තිර දෙය සිතමු
නිවනය සොයා යා යුතු තැන අපි සොයමු

**කුසුමා තිලකරත්න**
මලිදුව – බූස්ස

## නො වෙනස් ඇඳුම

විලාසිතා එක් කරනා නව පන්නේ
දිනදින ඇඳුම පරිහානියටයි යන්නේ
මෙය පරදවා කිතු ගොස අද පතුරන්නේ
'සිවුරයි' කිසිදාක නැහැ වෙනසක් වන්නේ

සම්බුදු පියාණන් මගධයෙ කෙතක් දැක
රැකෙනා විලස හිරි ඔත්තප්ප දෙක
චීවර මසන්නට තම පුතණුවන් නෙක
අමතා දිනක් මේ ලෙස දම් දෙසූ සේක

සිවුරේ අගය අඩුවන්නට කැබලි කොට
ලස්සන මකා ගන්නට දුර්වර්ණ කොට
වාටි මසා නැති කොට ගති මට සිළුට
චාම් ගතිය කැවූවා චීවරෙ තුළට

දුටු දන මන පිනවන චීවරෙ වටින
ඇඳුමකි ලොවේ කිසිදා වෙනසක් නොවන
වීතරාගි සම්බුදු පුත්වරු හිඳින
චීවරෙ රකිමු පණ මෙන් එහි තතු හැඳින

**අඹගහයායේ විමලා**
කෑල්ලගම



## එ දවස මෙ සිරිලක

දසත විසිර ඇත
පන්සල් වෙහෙර වැව්
මැව්නා නොවෙයි
පෙර රජ දරුවන්
ඉදි කෙරූ

පස් පව් නොකළ
පින් බිමකි
දුක් රෝ බිය
දුරුවුණ
එදවස
රැකුණා සියලු දෙන
බුදු බණ පසක් කොට

**එච්.පී.ජයන්ති සේනාරත්න**
පහළ වතුපිටිය

## විහාර මහා දේවි

රටක් වටින පුතෙක් හැදූව අම්මා රජු දේවී
රාජ පෙළපතින් පැවතෙන මිණි පහනක් දේවි
මුහුද ගොඩ ගලද්දී නවතා ලූ දේවි
අන් කවුරුත් නොවේ අපේ විහාර මහා දේවි

**වල්ගම්මුල්ල**
එස්. බී. සුමනාවතී.

## පැනයට පිළිතුර

තරුණිය:
බලනු මැන!
පෙති පිරුණු
පෙති නොපිරි
නෙක පාට
නෙක හැඩැති
රුවැති
ලොව තුළැති
අපමණක් පිපුණු මල්

යෝගාවචරයා:
නොදකිමි
මල් තුළැති
ඔබ කියන කිසිම වෙනසක්
දකිමි නිති
මල් ඇතුළු
ලොව සියලු දෑ තුළැති
අනියතය පමණක්

**මාලබේ**
කේ ඩබ්ලිව්. සිරිසේන

## සතුරා ඉදිරිපිට

බුදු ගෙයි
බුදු පාතේ
ශාන්ත නිශ්චල
ඇල්ල මෙන්
ඔබේ සතුරා ඉදිරියෙහි
නිහඬ ව
සිටගෙන සිටින්න

**උදයංග අමරසේකර**
ප්‍රංශය

## කවි කිවිඳියනට සතර පෝ දාට ම දහම් තුටු පඬුරු

බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.

## බුදුසරණ පහන් සිතක කවි

BCC

සම්පූර්ණ නම :– ..............................................
ලිපිනය :– ..............................................
දුරකථන අංකය :– ..............................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා, පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

# යසෝදරාවත කාව්‍යයෙන් සිතුවම් වන අසිරිමත් සිදුහත් උපත



**මහනුවර යුගයේ ලියැවුණු කෘතියක් බවට බොහෝ දෙනා විශ්වාස කරන යසෝදරාවත කාව්‍යයෙහි අන්තර්ගත කවි 130 පුරාවට ම ආගමික නැඹුරුතාවයක් දක්නට ලැබේ. එහි කවි 130 ම සරල වූ මිශ්‍ර භාෂා ශෛලියකින් ලැයැවී ඇති බැවින් පාසල් යන දරුවාගේ සිට වැඩිහිටි උගත් පරපුර දක්වා ම හොඳින් ධර්ම රසය විඳිමේ අවස්ථාව ලැබේ. මෙම කාව්‍ය කෘතිය තුළින් පාඨකයා නිර්වාණ මාර්ගය කරා මෙහෙයවන පුණ්‍ය කර්ම දෙසට යොමු කරවමින් ස්ත්‍රී පාර්ශ්වය පිළිබඳ ගෞරවාන්විත වූ භක්තිමත් හැඟීමක් ජනිත කරවීමට සමත් වෙයි.**

සංසාර සාගරයෙහි සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා පූරණය කළ අප මහ බෝසතාණන් වහන්සේ

**සූවිසි සංඛ්‍ය කප් ලක්ෂය පෙරුම් පූරා**
**මෝරා පුබුදු මල ලෙස බුදුවූ ලොව් තුරා**

යනාදී වශයෙන් මලක් මෝරා පුබුදු වූවාක් මෙන් ලොව්තුරු සම්මා සම්බුද්ධත්වය සාක්ෂාත් කරගත් දීර්ඝ ඉතිහාස තොරතුරු ඉතා සංක්ෂිප්ත ව හකුළුවාලමින් සඳහන් කෙරෙන පද්‍යයකින් යසෝදරාවත කාව්‍ය ආරම්භ කර ඇත. අනතුරුව දාන පාරමිතා පූරණය කිරීම, දීපංකර බුදුරජාණන් වහන්සේ විසින් නියත විවරණ ලබා දීම , සූවිසි බුදුරජාණන් වහන්සේලාගේ විවරණ ලබා වෙස්සන්තර ජීවිතය ගත කරමින් දෙව්ලොව දෙවියන්ගේ ආරාධනය මත පස්මහ බැලුම් බලා මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගැනීම, රන්යහනේ සැතපී සිටි මහාමායා දේවිය දුටු සිහිනය, බමුණු පඬිවරුන්ගේ අනාවැකි, මහාමායා දේවියගේ සල් උයන් ගමන, සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, සිදුහත් කුමරා ශිල්ප හැදෑරීම, යසෝදරාවන් සමඟ විවාහය, ගිහිගෙය හැර යාමට සූදානම් වූ අයුරු, අලුත උපන් රාහුල කුමරු දකින්නට යාම, මාළිගයෙන් පිටත්ව තපසට යාම, කන්ථක අසු හා ඡන්න අමාත්‍යයාට සමුදීම, යසෝදරාවගේ විරහ වේදනාව, යසෝදරාවගේ ප්‍රාර්ථනා, උතුම් වූ ලොව්තුරා සම්මා සම්බුද්ධත්වයට පැමිණ දම්සක් පැවැත්වීම, උත්තරීතර බුදුබව ලබා කිඹුල්වතට වැඩම කිරීම, සුද්ධෝදන පිය මහ රජතුමාට ධර්මය දේශනා කිරීම, රාහුල කුමරු පැවිදි කිරීම, යසෝදරාවෝ පැවිදිව රහත්වීම හා අමාමෑණි සම්මා සම්බුදු බුදුපියාණන් වහන්සේගෙන් සමුගෙන සෘද්ධි පෙළහර පාමින් පිරිනිවීම යනාදී වශයෙන් බුද්ධ චරිතය හා බැඳීපවතින වැදගත් අවස්ථා අන්තර්ගත කරමින් යසෝදරාවත කාව්‍ය රචනා කර ඇත.

ධර්ම රසය රමණීය ලෙස මැනවින් උද්දීපනය කෙරෙන යසෝදරාවත කාව්‍ය පැරැණි ජන සමාජයෙහි බොහෝ නිවැසියන් රාත්‍රී කාලයෙහි ගායනා කරන ලද රසවත් වූ ධර්ම ග්‍රන්ථයක් ලෙස ජනතාව අතර ප්‍රචලිත විය. එක් අයකු ගායනා කරන විට ගෙදර සියලු දෙනාම ඉතා සන්සුන් ව අසා සිටිමින් රස විඳිම අපේ අතීත ජනයාගේ සිරිත විය. දියුණු යැයි කියා ගන්නා වර්තමාන සමාජ පවුල් සංස්ථාව තුළ වෙන් වෙන් ව හුදකලා වෙමින් විද්යුත් උපාංග ජීවිතය කර ගත් අරුත්සුන් නීරස ජීවිත ඔවුන් තුළ පැවතුණේ නැත. කාව්‍යයම කතාන්තරයන්හි අන්තර්ගත බොහෝ ජීවන අත්දැකීම් තම තමන්ගේ ජීවිතවලට උකහා ගනිමින් පවුල් ජීවිත අර්ථවත් ව මෙන් ම සාර්ථක ව ද පවත්වාගෙන යාමට මෙවැනි ධර්ම සාහිත්‍යාංග බොහෝ සේ ඉවහල් විය. කාන්තාවකගේ මාතෘත්වය සහ සෙනෙහෙබර ස්වාමි දියණියකගේ වගකීම් අමතක නොකර කටයුතු කිරීමේ අගය යසෝදරාවත කාව්‍ය තුළින් ප්‍රකාශ කර ඇත.

අප මහ බෝසතාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා සිදු කළ අප්‍රමාණ වීර්යයත්, බෝසතාණන් වහන්සේ දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයෙහි නියත විවරණ ලැබූ උතුම් අවස්ථාවත් දක්වා ඇත. සුමේධ තාපස තුමන් දීපංකර බුදුරජාණන් වහන්සේ අතින් මල් අට මිටක් පූජා ලැබූ බව සඳහන් කර ඇත්තේ බෝසතාණන් වහන්සේ කෙරෙහි අප සිත් තුළ මහත් ශ්‍රද්ධාවක්, භක්තියක්,ගෞරවයක් ඇතිවන ආකාරයට ය.

**දීපංකර බුදුන් ලෝකෙට පහළ වෙනා**
**සුමේධ නම් තපසුව බෝසත් එදිනා**
**කඳුරැලියේ වැඩ සිටි මහතා එදිනා**
**මේ මහතා මතු බුදු වෙයි වදාරනා**

**සිරි හස්තෙන් මල් පූජා කළ තැනදී**
**දෙසිතක් නැතිව නියමයි එක සිත් පැහැදී**
**දෝත පුරා වැඳ පිදු රඹගම පුරදී**
**නියත විවරණේ ලැබුණේ එතැන්හි දී**

වෙස්සන්තර රජතුමා ලෙසින් දරුවන් දන් දෙමින් සාමාන්‍ය ලෝකයේ සමාන්‍ය මනුෂ්‍යයකුට කළ නොහැකි තරම් දාන පාරමිතාව පූරණය කළ අප මහා බෝසතාණෝ වෙස්සන්තර ආත්ම භාවයෙන් පසුව තුසිත දිව්‍ය ලෝකයෙහි ඉපදීම, බෝසතාණන් වහන්සේ පිළිබඳව ධර්ම ගෞරවයක් ජනිත වන ආකාරයට විස්තර කරයි. ඒ වගේම සම්මා සම්බුද්ධත්වය සඳහා මිනිස් ලොව ඉපදීමට කල් බලා වැඩ සිටිය බෝසත් දෙවිඳුන්ට දෙව් සැප සම්පත් අතහැර බුදුවීම සඳහා සුදුසු කාලය පැමිණ ඇති බව දෙවිවරු බෝසතාණන් වහන්සේට සිදුකළ ආරාධනය ද කවියා මෙසේ ප්‍රකාශ කර ඇත.

**කාලේ බුදු වෙන්ඩ සරිඋනිය මහතු නේ**
**ආලේ ඉතින් ඇරලා යමු සුවාමි නේ**
**කාලේ බලා වැඩසිටි බෝසත් එදි නේ**
**සීලේ ගුණේ බැලූවොත් උපදින්නට අ නේ**

**දීපේ දේසේ උපදින කුල කොතන බලා**
**කෝපේ නොවී මව්පිය කව්ද විමසලා**
**රූපේ කව්ද සරණේට මට සිතා බලා**
**දීපේ උතුම් දඹදිව දිවසින් දැකලා**

මේ ආකාරයෙන් කාලය,දේශය, දීපය, කුලය, මව්පියන් යන පස්මහ බැලුම් විමසා බලා දඹදිව මහාමයා දේවියගේ කුස ඉපදීමට සුදුසු බව දැක සුද්ධෝදන පියාණන් වහන්සේ හා පන්සියයක පමණ කිරි මෑණිවරුන්ගේ ආරක්ෂාව, රැකවරණය මැද ආත්ම ගණනාවක සිට පාද පරිචාරිකාව ලෙස තමා හා එක්ව පැමිණෙන යසෝදරා අගමෙහෙසිය දැක දඹදිව ඉපදීමට සුදුසු කාලය පැමිණ ඇති බැවින් එය තීරණය කළ යුතු බව විස්තර කරයි.

අනතුරුව මහාමායා දේවිය දුටු සිහින විස්තර කරන කවියා දේවිය දනක් පමණ සුවඳ මල් අතුරන ලද යහනෙහි සැතපුණ බව ප්‍රකාශ කරයි. එම සිහින තුළ දෙනෝ දහක් අඟනෝ දේවියට මල් නෙළීමෙහි යෙදී සිටි බවත්, අනෝතප්ත විල මැද යහනක් පනවා එහි හිඳුවා කන්‍යාලියන් විසින් පැන් නැවීම සිදු කළ අයුරුත් අනෝතප්ත විල සිහිනෙන් දුටු ආකාරයත් විස්තර කරයි. ශ්වේත වර්ණවත් වූ ඇත් පැටවකු පැමිණ සුදු හොඩින් මායා දේවියගේ කුස පිරිමැදී සිහින පිළිබඳ තොරතුරු දේවිය විසින් සුද්ධෝදන මහ රජතුමාට සැලකර සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිහින පලාපල පිළිබඳ රජු බමුණු පඬිවරුන්ගෙන් විමසා සිටී.

**මෙතුන් ලොවට නායක පුන්සඳ ලෙසට**
**උතුන් බෝසතෙක් උපදිය තුන් ලොවට**

තුන් ලොවක් සනහාලන, තුන් ලොවක් ආලෝකවත් කරන පුන්සඳක් වන් තුන්ලොවට ම නායක වන උතුම් බෝසතාණන් වහන්සේගේ උප්පත්තිය පිළිබඳ සිහිනයක් බවට පඬිවරුන් විසින් විග්‍රහ කරයි.

අනතුරුව මහා මායා දේවිය කුමාරෝත්පත්තිය සඳහා දෙව්දහ නුවර තම මව්පියන් කරා යාමට පිටත්ව යයි. අතරමඟ හමුවන මලින් සුවඳවත් වූ, බමරුන්ගෙන් සමනලුන්ගෙන් පිරී ඉතිරී ගිය සුන්දර ලුම්බිණි සල් උයනේ මදක් විවේක ගත් ඕ තොමෝ සල් අත්තක් අල්ලාගත් බවත්, ඒ අවස්ථාවේ සල් ගස් වටකොට වටතිර ඇඳි බවට බුද්ධ චරිතයෙහි සඳහන් කතාව විස්තර කර ඇත්තේ මෙසේ ය.

**කල් දැනුණේ දසකඩ මස පිරුණු තැනේ**
**රැල් පුලුනේ බරකුත් බඩට නොදැනුණේ**
**මල් පවනේ එන ලෙස සොඳ සිසිල් දැනේ**
**සල් උයනේදීව ද කුමරු බිහි උනේ**

යනුවෙන් සිද්ධාර්ථ කුමාරෝත්පත්තියෙහි අසිරිමත් බව ගෞරවාන්විත ව සිහිපත් කිරීමට යසෝදරාවත කවියා පෙළඹී ඇති අයුරු අතිශයින් ආස්වාදජනක ය. එම පරිසරයේ පැවැති සුන්දරත්වය සිහිපත් කිරීමට ද ඔහු අමතක නොකරයි.

සජීවී චිත්ත රූප මැවීමට තරම් කවියා පොහොසත් වෙයි. මෙම දේශීය පැරැණි සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමේ වැදගත්කම වර්තමාන සමාජය බොහෝ සේ වටහා ගත යුතු ය. අප ජීවත්වුණේ කොතැන ද? කුමන පරිසරයක ද? අද අප ගමන් කරන්නේ කෙබඳු දිශාවකට ද? මානසික සුව සහනය සොයා අපේ පැරැණ්නන් ගිය මඟ අප යා යුතු නොවේ ද?

හේමමාලා රන්දුනු

# බුදුසරණ





අදින් වසර තිස්හත් දහසක් පමණ ඈත අතීතයේ අපේ මුතුන් මිත්තන්ගේ ජීවයේ සාක්කිය, ප්‍රාග් ඓතිහාසික වටිනාකම් රැසක් පස් යට සඟවා ගත් පාහියංගල පුදබිම, බුලත්සිංහල ක්ෂේම භූමිය සාලංකාර ව දිදුලවන්නට සමත් විය. කුඩා ගඟ ආදි අතු ගංගා රැසකින් සුපෝෂිත බුලත්සිංහල කළුගම් කොමලියගේ පහස විඳින්නේ තම සශ්‍රීකත්වය ලෝකයට විදහාමිනි. මාකිරි ඇල්ල, ගිනිගෙදර ඇල්ල ආදි දිය දහරා ද, බුලත්සිංහල මාතාවගේ දිගු කෙහෙරැල්ල මෙනි. රාජ මහා විහාර රැසකින් සමුපශෝභිත බුලත්සිංහල පුරවරයේ, මහ පන්සල යැයි විරුදාවලිය ලත් දේවමිත්තාරාමය සත්‍යය වශයෙන් ම නමට අන්වර්ථ වූ මහපන්සලකි.

බුලත්සිංහල දේවමිත්තාරාමය බස්නාහිර පළාතේ පස්යොදුන් කෝරළයේ බුලත්සිංහල ප්‍රාදේශීය ශාසනාරක්ෂක බලමණ්ඩලයට අයත් පුරාණ විහාරයකි. හොරණ කලවැල්ලාව හරහා මතුගම මාර්ගයේ ඇගල්ඔය පසුකොට හොරගස් හන්දියෙන් වමට හැරී මීටර් 500 පමණ ගිය තැන මෙම වෙහෙරට ළඟා විය හැකි ය. (මාර්ග රැසක් ඇත.)


මෙම විහාරස්ථානයේ ආරම්භක වර්ෂය වශයෙන් අනුමාන කරන්නේ 1850 වසරයි . 1856 දී පමණ නාරගල දේවමිත්ත නම් යතිවරයාණ කෙනෙක් මෙම විහාරස්ථානය ආරම්භ කරන්නට ඇතැයි සැලකේ. එ සමයේ පුරාණ බුද්ධ ප්‍රතිමා ගෘහය ඉදි කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. මන්ද විහාර ගෘහයේ ප්‍රධාන පිවිසුම් දොරටුවට ඉහළින් බුදුගෙයි වැඩ අවසන් කළ වර්ෂය බු.ව. 2410 (ක්‍රි. ව. 1867) බව සටහන් වීම යි. ඒ අනුව මේ වන විට මෙම විහාරය වසර 142 ක ඉතිහාසයකට උරුමකම් කියයි.

මෙම බුද්ධ ප්‍රතිමා මන්දිරය පිට මාලය හා ඇතුළු මාලය වශයෙන් දෙ කොටසකි. විහාරය දෙස විමසුම් ඇසින් බලන විට පෙනී යන්නේ විහාර ගෘහයට ආලින්ද කොටස පසුව එක් කොට ඇති බව යි. 1986 දී ද මෙම විහාරයේ ප්‍රතිසංස්කරණයක් සිදු වී ඇත. මෙම විහාර ගෙයි පිළිම දෙකක් දැකගත හැකි ය. පළමු වැන්න නම් හිටි ඉරියව්වෙන් යුතු සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ යි. අනෙක හිටි ඉරියව්වෙන් යුතු විශ්ණු ප්‍රතිමාව යි. බුද්ධ ප්‍රතිමාවේ ශීර්ෂය මීට දශක කිහිපයකට පෙර වෙනස් කොට ඇති අතර, එහි දී ප්‍රතිමාවේ දැවමය සිරස්පතය වෙනුවට සිමෙන්තියෙන් තැනූ සිරස්පතයක් සවි කොට ඇත. මහනුවර යුගයේ සහ කොළඹ යන යුගවල ශෛලින් මිශ්‍ර වී ඇත. ශ්‍රී හස්තයන් සමාධි මුද්‍රාවෙන් නිරූපිත අතර, දෙපා වීරාසනයෙන් යුක්ත ය. පිළිම වහන්සේගේ සිරස මත මාලක තුනකින් යුත් අලංකාර ශීර්ෂාවරණයකි. මෙය මුල්කාලීන ස්වරූපයෙන් ම ඇතැයි විශ්වාස කළ හැකි ය. මිට අමතර ව විහාරයේ චිත්‍ර පුරාවිද්‍යාත්මක වටිනාකමින් අනූන ය. ඇතළු මාලයේ බිතුසිතුවම්හි සත්සතිය දක්වා ඇත. සිවිලිමේ චිත්‍රයන්හි නෙළුම් මල් 80ක් දැක්වීමෙන් අසු මහා ශ්‍රාවකයන් වහන්සේ අර්ථ ගන්වන්නට ඇතැයි මතයකි.


ඊට අමතර ව බුද්ධ චරිතයේ විශේෂ සිදුවීම්, දේව රූප, මල් මොස්තරාදිය මෙහි අලංකාරවත් ව චිත්‍රණය වී ඇත. පිවිසුම් මකර තොරණේ කිසිම ආයුධයක් නො දැකීම විශේෂිත ය. කෙසේ වෙතත් මෙම චිත්‍රකරු කවුරුන් ද යන්න හරියාකාරව තේරුම් ගත නො හැකි වුවත් මහනුවර යුග ශෛලිය අනුව ගිය පහතරට කෙනකු බව මතය යි.

දඹදෙණි යුගය වනාහි ශ්‍රී ලාංකේය වංසකතාවේ ස්වර්ණතම යුගවලින් එකකි. එයිනුත් කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත දෙවැනි පරාක්‍රමබාහු නරපති යුගය සුවිශේෂිත ය. පස්යොදුන් රට පිහිටි කෙසෙල්හේනා රාජ මහා වෙහෙරෙහි ආරම්භය ද මෙම සමය (ක්‍රි.ව. 1250) යි. ඉන් ශතවර්ෂ 8ක් පමණ ගෙවෙයි. සසුන පිරිහෙයි. කෙසෙල්හේනා වෙහෙර කැලෑවට යයි. ඒ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල භූපතින්ගේ කාලය යි. වල් කපනු පිණිස කැළයට ගිය ගැමියෙක් වල් වැදුණු කෙසෙල්හේනා අරම දකී. එහි ප්‍රතිඵලය වූයේ නැවත ආරමයේ ප්‍රතිසංස්කරණය වීම යි. නූතන ශාසනෝද්දිප්තියේ යුගකාරයන් වහන්සේ වූ අසරණ සරණ පිණ්ඩපාතික සරණංකර සංඝ රාජයාණන් වහන්සේගේ දසවෙනි ශිෂ්‍යයා වූයේ වේහැල්ලේ ධම්මදින්න මාහිමිපාණන් ය. උන් වහන්සේට ද ශිෂ්‍යයන් හතළිස් එක් දෙනෙක් වූ අතර, උන් වහන්සේගේ ශිෂ්‍යයන් වහන්සේ නමක් වූ කෙසෙල්හේනාවේ ධම්මක්ඛන්ද හිමියෝ ප්‍රථම වරට කෙසෙල්හේනා රාජමහා විහාරයේ විහාරාධිපති වූ හ.


ගම් වැසියන් විසින් රත්නපුර මාර්ගයෙන් සිරිපා වන්දනය පණිස යන



වර්තමාන විහාරාධිපති අමරගෙදර නන්දදේව හිමි



දේවමුල්ලේ ශ්‍රී ගුණානන්ද හිමි



ඉඹුලාගොඩ සද්ධාතිස්ස හිමි

# පස්දුන් රට එළිය කළ පින්කෙත

# බුලත්සිංහල දේවමිත්තාරාම මහ පන්සල

මුන් වහන්සේ නවතා මෙම ආරාමය සුද්ධ කොට නවත්වා ගනු ලැබූ බව කියැවේ. විටින්විට විවිධ මාහිමිවරුන් මෙහි අධිපතිකම් දරා ඇත.

කාලයාගේ ඇවෑමෙන් විහාරාධිපති ධුරයට පත් වන කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහා සංඝ සභාවේ උපාධ්‍යාය ධුරන්ධර දේවමුල්ලේ ශ්‍රී ගුණානන්ද නාහිමියෝ බුලත්සිංහල දේවමිත්තාරාමයේ දෙවන විහාරාධිපතීන් වහන්සේ ය. උන්වහන්සේට ප්‍රධාන ශිෂ්‍යවරයන් පස් නමක් වූ අතර, උන් වහන්සේගෙන් පසු කෙසෙල්හේනා රාජමහා විහාරයේ අධිපති භාවය ජ්‍යෙෂ්ඨයා වූ කොබවක සුගතපාල හිමියන්ට පැවරුණු අතර, බුලත්සිංහල මහ පන්සලේ අධිපතීත්වය ඊළඟ ජ්‍යෙෂ්ඨත්වයෙහි ලා සිටි ඉඹුලේගොඩ සද්ධාතිස්ස හිමියන්ට පැවරුණි. මහ පන්සලේ මුල් ම විහාරාධිපතීත්වයට පත් වන්නේ නාරගල ශ්‍රී දේවමිත්ත හිමියන් ය. පසුව දේවමුල්ලේ ගුණානන්ද, ඉඹුලේගොඩ සද්ධාතිස්ස, බුලත්සිංහල නන්දාරාම යන හිමිවරු අධිපතිකම් දරා ඇත.

උන් වහන්සේලාගේ අපවත් වීමෙන් පසු නූතනයේ විහාරාධිපතිත්වය දරමින් බුලත්සිංහල නන්දදේව පස්දුන් රට සංඝ නායක නාහිමිපාණෝ දේවමිත්තාරාමයේ ස්වර්ණතම යුගය සනිටුහන් කරමින් සිටිති.


බුලත්සිංහල දේවමිත්තාරාම මහ පන්සල පස්දුන් රටේ ජීවනාලිය යි. පින් කෙත යි.

තොරතුරු සහ සේයා රූ ලබා දුන් බුලත්සිංහල ජනාන්ද හිමියන් මෙහි ලා ගෞරවයෙන් සිහිපත් කරමි.



ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
පිටිපන
**බුලත්සිංහල සිරි ඤාණරතන හිමි**





වර්ෂ 2021 ක් වු ඔක්තෝබර් 28 බ්‍රහස්පතින්ද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.